විසංයෝජනයේ විකට රූප

1996 පෙබරවාරි අප්‍රේල් ප්‍රවාද 11 වන කලාපයට 'ඩෙරීඩා හැදෑරීමට හැදෑරීමක්' යනුවෙන් ලිපියක් දීප්ති කුමාර ගුණරත්න විසින් ලියන ලද අතර එය ඩෙරීඩාගේ දර්ශනය ලංකා සමාජයට විධිමත්ව හඳුන්වා දීමේ පළමු අවස්ථාව විය. මෙම ලිපියේ අන්තර්ගතය වූයේ ජර්මන් දර්ශනය හා ප්‍රංශ දර්ශනය හරහා ඩෙරීඩියානු චින්තනය ගොඩ නැගෙන ආකාරය පෙන්වාදීම ය. මෙහිදී ජර්මන් දර්ශනවාදය තුළ එඩ්මන්ඩ් හුසල්, මාර්ටින් හෙඩගර් යන අය ඩෙරීඩාට සම්බන්ධ වන ආකාරයත්, ප්‍රංශ දර්ශනය තුළ සෝෂියර්, ලෙවි ස්ට්‍රවුස්, ලැකාන්, බාර්ත්ස් යන අයගේ දාර්ශනික සමස්තය තුළ ඩෙරීඩා ස්ථානගත වන්නේ කොතැන ද යන්නත් සාකච්ඡා විය.

මෙම ලිපිය මගින් ඩෙරීඩියානු චින්තනයට අදාළ සියලු සංකල්ප පැහැදිලි නොකළ නමුත් ඩෙරීඩා හදාරන්නෙකුට ඇරඹිය යුතු ස්ථානය ගැන සවිඥානක කිරීමක් කළේ ය.

මෙම ලිපියෙන් පසු විසංයෝජනය යන්න ලංකාව තුළ ජනප්‍රිය මාතෘකාවක් විය. විසංයෝජනයට පක්ෂපාත වූවන් මෙන් ම විසංයෝජනයේ සතුරන් ද බිහි විය. විසංයෝජනය ලංකාවට අලුත් දෙයක් නොවන බවත් අපගේ සම්ප්‍රදාය, විශේෂයෙන් ම බුදුදහම තුළ විසංයෝජනය දැනටමත් තිබෙන බවටත් ප්‍රකාශ ඉදිරිපත් විය.
නලින් ද සිල්වා විසංයෝජනය ගැන මෙසේ අදහස් දක්වා ඇත.

"පශ්චාත් නූතනවාදයේ කියවෙන ඊනියා විසංයෝජනය (deconstruction) තරම් ළාමක දෙයක් තවත් නැත. මෙය මහා දෙයක් ලෙස බටහිරයන්ට පෙනී ගිය ද (බටහිර දර්ශනය ඉතා ම නොගැඹුරු බව අමතක නොකළ යුතු ය) වෙනත් බටහිර දර්ශනවාදවල මෙන් ම මෙහි ද ඇත්තේ වචන ටිකක් පමණි. විසංයෝජනය අවසාන වශයෙන් ගත් කළ පශ්චාත් නූතනවාදයේ බංකොළොත් බව පෙන්වන්නා වූ මතවාදයකි. එහි පදනමේ ඇත්තේ මිනිසා භාෂා නිර්මිතයක් ය යන්න ය. මිනිසා ක්‍රියා කරන්නේ භාෂාවේ ඇති වචන, යෙදුම් ආදිය විසින් කෙරෙන මෙහෙයුමක ප්‍රතිඵලයක් ලෙස යැයි පශ්චාත් නූතනවාදියෝ කියා සිටිති. බටහිර සංස්කෘතිය සුදු - කළු වැනි ද්විමය විරුද්ධයන් (binary oppositions) මත පදනම් වන බවත්, පැවැත්ම පිළිබඳ ප්‍රශ්නය එහි කේන්ද්‍රීය අංශය බවත් පවසන ඔවුහු භාෂාවේ යෙදුම් තුළ සුදු - කලු වැනි ද්විමය විරුද්ධයන්ගෙන් එක් අර්ධයකට අනෙක් අර්ධය අභිබවා යන වැදගත් කමක්, බලයක් ලබා දෙන බවත් පවසා මේ වැදගත්කම හා බලය හෙළිදරව් කිරීම සඳහා භාෂා විශ්ලේෂණය කිරීමෙන් ඒ සැඟ වී ඇති බලාධිකාරය හෙළිදරව් කිරීම විසංයෝජනයේ ප්‍රධාන අරමුණ වෙයි. වඩා සාධාරණය (පොදුවේ - in general) ගත හොත් විසංයෝජනයෙන් යමක් ප්‍රකාශ කෙරෙන සන්දර්භය විශ්ලේෂණය කෙරෙයි. මේ කියන්නේ මහා ලොකු දෙයක් නොවේ. බටහිර ඒක රේඛීය චින්තකයන්ට එය ගැඹුරු දෙයක් ලෙස පෙනී ගිය ද බුදුන් වහන්සේ දෙසූ සංඛාර ගැන අවබෝධයක් ඇති සිංහල බෞද්ධයන්ට විසංයෝජනය යනු තුට්ටු දෙකේ වැඩකි. හිටපු කතෝලික පූජකවරුන් වැනි බුද්ධාගම ගැන බෞද්ධයන්ට ඉගැන්වීමට කැස කවන ඇතැමුන් සංඛාර යනු විසංයෝජනය යැයි පෙන්වීමට තැත් කළ ද එය එසේ නොවේ. විසංයෝජනය ද සංඛාරයකි. එය ද මිනිසුන්ගේ නිර්මාණයකි. එබැවින් එයට විසංඛාර යැයි කිව නොහැකි ය...

විසංයෝජනයත් විසංවාදයක් වෙයි. ඊනියා විසංයෝජකයන්ට විසංයෝජනය විසංයෝජනය කළ හැක්කේ චක්‍රීය චින්තනයකට ය... ඩෙරිඩලා, විට්ගන්ස්ටෙයින්ලා මහා දාර්ශනිකයන් වන්නේ සිංහල ථෙරවාදී බෞද්ධයන්ට නොව බටහිරයන්ට හා ඔවුන් අනුකරණය කරන්නවුන්ටය."

නලින් තවදුරටත් මෙසේ කියයි.

"ඊනියා විසංයෝජකයෝ කිසි දිනක බටහිර දැනුම විසංයෝජනය නොකරති. එහි ඇති ඒකාධිපති බව, ආධිපත්‍යය, සංස්කෘතික යටත්විජිතවාදය සමග බැඳී ඇති ආකාරය, බටහිර දැනුම අප මත බලෙන් හා උපක්‍රමයෙන් පැටවීම, බටහිර දැනුමේ යුදෙව් ක්‍රිස්තියානි පදනම, බටහිර දැනුම යොහොවා දෙවියන් වහන්සේ සමග බැඳෙන අයුරු ආදිය කිසිවිටෙකත් විසංයෝජනය නොවේ. බටහිර දැනුම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට සාපේක්ෂ බව විසංයෝජකයන්ට හසු නොවේ. බටහිර විද්‍යාවේ වාස්තවිකත්වය යනු බොරුවක් බව විසංයෝජකයෝ හෙළි නොකරති. කෙටියෙන් කිවහොත් යථාර්ථය, වාස්තවිකත්වය ආදිය යොහොවා දෙවියන් වහන්සේගෙන් ගලා එන දේ බව ඔවුහු නොකියති. ඒ වෙනුවට ඔවුහු බටහිර දැනුමේ ඊනියා වාස්තවිකත්වයත්, එහි ආධිපත්‍යයත් දණ්ඩ නමස්කාරයෙන් පිළිගනිති. දීනයන්ට රසයක් ඇත්තේ දීනත්වයේ ම පමණකි. පණුවා අශුචි සොයා යන්නාක් මෙන් පශ්චාත් නූතනවාදියා (පණුවා) දීනත්වය සොයා යයි."

-නලින් ද සිල්වා, අපේ ප්‍රවාද 2, පිටු 35-37-

නලින් ද සිල්වාට පශ්චාත් නූතනවාදය හා පශ්චාත් ව්‍යුහවාදය එකක් ම වී ඇත. බුදුදහමේ එන විසංඛාර දන්නා කෙනාට විසංයෝජනය මහ ලොකු දෙයක් නොවන බවත් දක්වා ඇත. නලින්ට විසංයෝජනයත් තවත් එක් සංකල්පයක් ම වෙයි. ඔහු විසංයෝජනය විසංයෝජනය කිරීමේ ක්‍රමයක් බුදුදහමින් සොයාගෙන ඇත. විසංයෝජනය ගලා එන්නේත් දෙවියන් වහන්සේගෙන් යැයි ඔහු කියා සිටී. මේ එකදු කාරණයක් ඩෙරීඩා ලියූ 50 ක් පමණ පොත්වලින් හා සිය ගණනාවක් ලිපි තුළින් සොයාගත නොහැකි ය. නමුත් ඔහු විසංයෝජනය සම්බන්ධයෙන් තමන්ට හිතෙන දෙයක් පවසා ඇත. මෙය විසංයෝජනය සම්බන්ධ නලින් ගේ 'මගේ ලෝකය' වෙයි.

විසංයෝජනය ගැන කතා කළ තවත් කෙනෙකුගේ අදහස් කිහිපයක් සලකා බලමු. මේ චම්පික රණවක විසංයෝජනය තේරුම් ගෙන ඇති ආකාරය යි.

"පශ්චාත් නූතනවාදය තුළ ඉහත කී අධිපතීත්වයන් (විඥානය ද්‍රව්‍යයන්ට යට කිරීම, පරිසරය මිනිසාට යට කිරීම, ධනපතියාට නිර්ධනයා යට කිරීම, සෝවියට් දේශයේ දී නිර්ධනයාට ධනපතියා යට කිරීම, පුරුෂයාට ස්ත්‍රීන් යට කිරීම, ආසියාවට බටහිර යට කිරීම - අවධාරණය මගේ) පශ්චාත් නූතනවාදය යටතේ විසංයෝජනය වෙයි.

දේශපාලන පක්ෂවලට තම ඉරණම බාරදීමෙන් ධනපතීන් මෙන්ම නිර්ධනීන් ද විසංයෝජනය වෙයි.....

බොහෝ සෙයින් විසංයෝජනය වෙමින් පවතින්නේ යුරෝ - කේන්ද්‍රියවාදය යි. ඒ සමග ම සුදු වර්ගවාදය ද අභියෝගයට ලක් වේ. ලෝකයේ නව ආර්ථික කේන්ද්‍රයක් ලෙස ආසියාව නැඟ ඒමත් සමග යුරෝපීය විසංයෝජනය ඇරඹී ඇත. මේ සමග ම යුරෝපීය කේන්ද්‍රයක් වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන් වැනි ආයතනවල බලය විසංයෝජනය වීමට නියමිත ය.

විශේෂඥතාව විසංයෝජනය වීම පශ්චාත් නූතනවාදය තුළ අංගයකි. මෙයට බොහෝ සෙයින් ආයතනගත දැනුම, පරිගණක හා තොරතුරු සන්නිවේදනය ඔස්සේ ගලා යාම බලපා ඇත. පාසැල් හා විශ්ව විද්‍යාල විසංයෝජනය ඊළඟ පියවරයන් ය.

බුදුදහමට අනුව පුද්ගලයා විසින් ගොඩනගන නාම - රූප සබඳතා හෙවත් සංස්කාරවල සාපේක්ෂතාවය පෙන්නා දෙනු ලැබී ය. නිර්වාණය, පුද්ගලයා හා සංකල්පය විසංයෝජනය ලෙසත්, උපාදාන බිඳීම විසංඛාර ලෙස ගැනීමත් ඇතැම් පශ්චාත් නූතනවාදී බෞද්ධයන්ගේ නව අදහස් ලෙස පළ වී ඇත.....

ජාතික රාජ්‍යය හා ජාතික දේශපාලනය විසංයෝජනය වේ ද? වත්මන් ලෝක ක්‍රියාකාරිත්වය තුළ එවැන්නක් දැක ගන්නට ඇත. අනිත් අතින් මේ විසංයෝජනය පුද්ගලයා කරා ගෙන ගිය විට ලැබෙන්නේ කුමක් ද? පුද්ගලයා හා ඔහු තැනී ඇති ඝන, ද්‍රව, වායු ශක්ති හා විඥාන වැනි ධර්මතාවලට විසංයෝජනය කළ හැක.

මේ අනුව විසංයෝජනයේ ක්‍රියාවලිය පුද්ගලයාට යෙදූ විට එය නිර්වාණයේ මඟ බව පෙනී යයි."

-චම්පික රණවක, සිහළ අභියෝගය, පිටු 63-66-

මේ විග්‍රහයට අනුව ගොඩනැගිලි, ආයතන, පංචස්කන්ධය, විශ්ව විද්‍යාල, ජාතික රාජ්‍යය විසංයෝජනයට ලක් කළ හැකි ය.

නලින්ගේ හෝ චම්පිකගේ ආකාරයේ කිසිදු විසංයෝජනයක් අඩු ම වශයෙන් ඩෙරිඩාගේ *Of Grammatology* වලට ගයාත්‍රි ස්පිවැක් ලියූ හැඳින්වීම තුළ හෝ *Dissemination* වලට බාබරා ජොන්සන් ලියා ඇති හැඳින්වීම සිහි බුද්ධියෙන් කියවන කෙනෙකුට හෝ හමු නොවනු ඇත. අප ප්‍රවාද, ලන්ඩන් සඟරාවලට විසංයෝජනය සම්බන්ධයෙන් ලියූ කිසිදු ලිපියක එවැනි ආකාර විසංයෝජනයන් ගැන ලියුවේ නැත.

විසංයෝජනයේ ඉහත විකට රූපයන්ට අමතර ව තවත් විකට රූපයන් ගණනාවක් නලින් සුවාරිස් අතින් ද බිහි වී ඇත. නලින් සුවාරිස් ලංකාව තුළ මුලින් පෙනී සිටියේ විසංයෝජනය ක්‍රමානුකූල ව ලංකාවට හඳුන්වා දීමට පැමිණි බුද්ධිමතෙකු ලෙස ය. ඔහු ප්‍රවාද 14 වන කලාපයට *'ඩෙරීඩාගේ විසංයෝජන රීතිය සහ බුදුන්ගේ අනන්තාවාදය සමාජ විවේචනයක් ලෙස'* යනුවෙන් ලිපියක් ලියූ අතර එම සඟරාවට ම පසුව ලියූ නමුත් පළ නොවූ ලිපියක් වශයෙන් *'ඩෙරීඩාගේ ඩීකන්ස්ට්‍රක්ෂන් හෙවත් විසංකාර කිරීම'* ලෙස තවත් ලිපියක් ඉදිරිපත් කර ඇත. ඔහුගේ ආචාර උපාධිය ලෙස ඉදිරිපත් කළා යැයි ඔහු කියන *The Buddha's Way to Human Liberation* නම් කෘතිය තුළත් ඩෙරීඩා හා විසංයෝජනය සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කර ඇත. මෙයට අමතරව ප්‍රවාද 27 කලාපයට *'ජාක් ඩෙරීඩා ස්වයං - විසංයෝජනය වෙයි'* යනුවෙන් ලියා ඇති ලිපියේත් මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් වී ඇත. මේ ලිපි හා පොත ආශ්‍රයෙන් අපගේ විවේචනය ඉදිරිපත් කර සිටිමු.

නලින් සුවාරිස් *'ජාක් ඩෙරීඩා ස්වයං-විසංයෝජනය වෙයි'* යනුවෙන් දක්වන ලිපිය තුළ *'ස්වයං-විසංයෝජනය'* යනුවෙන් නව සංකල්පයක් හඳුන්වා දෙයි. මෙහිදී ඔහු විසංයෝජනය බුදු දහමේ එන 'විසංඛාර' යන්න සමග අනන්‍ය කර දක්වයි. මෙයට අමතර ව බුදුදහමේ එන පටිච්ච සමුප්පාදය සමග මම, නොමම (අනෙකා) අතර තිබෙන සම්බන්ධය ම ඩෙරීඩා ද සොයාගෙන ඇතැයි ඔහු දක්වා සිටියි. ඔහු තවදුරටත් මූල පරියාය සූත්‍රය තුළ තිබෙනවා යැයි දක්වන, නමුත් මූල පරියාය සූත්‍රය තුළ නොමැති පාලි පාඨයන් ද උපුටා දක්වයි.

"ඉමස්මිං සති ඉදං හෝති
ඉමස්සාපදා ඉදං උප්පජ්ජාති
ඉමස්මිං අසති ඉදං න හෝති
ඉමස්ස නිරෝදා ඉදං නිරුජ්ජති

මෙය පසුකාලීනව ඩෙරීඩා විසින් ද සොයා ගෙන ඇතැයි ඔහු දක්වයි. ඔහු සිය ප්‍රවාද ලිපියේ මෙසේ ද දක්වයි.

"ඩෙරීඩා තම ජපන් මිතුරෙකුට ලියූ ලියුමක deconstruction යන්න තේරුම් කරදීමට උත්සාහ කළේ ය. එහිදී ඔහු කියා සිටියේ විසංයෝජනය යනු සිදුවීමකි. එය හැදෑරීමක් හෝ මෙනෙහි කිරීමක් හෝ කර්තෘවරයෙකුගේ මැදිහත්වීමක් වන තෙක් බලා සිටින ක්‍රියාදාමයක් හෝ නොවේ. විසංයෝජනයේ ස්වභාවය ස්වයං - විසංයෝජනය *self deconstruction* වීමයි. අවසානයේ දී ජාක් චින්තකයාණෝ ද අපවත් වූහ. පුරාණයේ පටන් වයධම්මා සංඛාරා යනුවෙන් යෝජනා කර තිබුණේ මෙයම නොවේ ද?"

ආමෙන්!

මේ අනුව ඩෙරීඩා (කතුවරයා) හිටියත්, නොහිටියත් ප්ලේටෝගේ, නීට්ෂේගේ, හුසල්ගේ, හෙඩගර්ගේ, ජෝන් සර්ල්ගේ, ලෙවි ස්ට්‍රවුස්ගේ හා සෝෂියර්ගේ වියමන් ඉඛේම විසංයෝජනය වීමට නියමිතය. මේ සඳහා ඩෙරීඩාගේ මැදිහත්වීමක් අවශ්‍ය වන්නේ ද නැත. එපමණක් නොව ඩෙරීඩාගේ මරණයත් (අපවත් වීම) විසංයෝජනයකි. ශරීරය මියගොස් කුණුවී ඕජස් ගලා ඇට සැකිල්ලක් බවට පත්වීමත් විසංයෝජනයකි. මේ අනුව ලංකාව තුළ *වයධම්මා සංඛාරා* යන බැනරය යටතේ මිය පරලොව ගිය බොහෝ දෙනෙක් විසංයෝජනය වී ඇත. ලංකාවේ අපවත් වූ හාමුදුරුවරුන් විසංයෝජනය වී ඇත. සුවාරිස්ට අනුව 2004 ඔක්තෝම්බර් 08 දින ඩෙරීඩා භෞතිකව මිය යාමෙන් පසු ඔහු විසංයෝජනය වී ඇත!

සුවාරිස් *The Buddha's Way to Human Liberation* කෘතියේ බුදුන්ව හා ඩෙරීඩාව අනන්‍ය කරමින් තවදුරටත් කරුණු දක්වයි (පිටු 179-180) ඔහුට අනුව ඩෙරීඩා සමකාලීන ප්‍රති-පාරභෞතිකවාදී දාර්ශනිකයකු ලෙස න්‍යායාත්මකව බුදුන් ගිය මගට පිවිස ඇත. බුදුන්ගේ විසංඛාර හා ඩෙරීඩාගේ විසංයෝජනය අතර තුළ්‍ය බවක් ඇත. ඩෙරීඩා විසංයෝජන විධි ක්‍රමයෙන් වාග් විද්‍යාත්මක හා අනෙකුත් සංකේතීය ගොඩනැංවීම්වල දෘෂ්ටිවාදී අන්තර්ගතය විසංයෝජනය කරන විට බුදුන් එයිනුත් ඔබ්බට ගොස් තමන්ගේ විසංඛාරය ආචාර ධර්මීය ප්‍රැක්සිසයන් ලෙස දුක මුලිනුපුටා දැමීමට යොදාගෙන ඇත. ඩෙරීඩා විසින් පාරභෞතිකයන් *විසංයෝජන මිටි* පහරින් කුඩුකර දමා ඇත. බුදුන්ගේ 'අනිච්චා' (anicca) සේම විසංයෝජනය ද ඉබේ සිදුවෙයි. (desconstruction happens) *It does not await an angel of destruction* දේවල් ඒ තුළම විසංයෝජනය වෙයි. *'things deconstruct themselves'* සුවාරිස්ට අනුව බුදුන් කියූ 'සබ්බේ සංඛාරා අනිච්චා' ඩෙරීඩා කියූ දෙයමය. *'all construction are impermanent-constructs deconstruct themselves because of their constructed character and underlying impermanence. They are not solid and unchangeable 'things'. Therefore, they can be deconstructed.'*

සුවාරිස් තම තර්කය තහවුරු කර ගැනීමට උපුටා දක්වන්නේ ඩෙරීඩා විසින් ලියූ *Letter to a Japanese Friend* නම් ලිපියයි. තමන්ගේ පොතේ සුවාරිස් එයට අදාළ පාඨය මෙසේ උපුටා දක්වයි.

It is an event that does not await the deconstructs itself [ca se deconstruct]. (Therefore) it can be deconstructed. The 'it' [ca] is not here an impersonal thing that is opposed to some egological subjectivity. It is in deconstruction to deconstruct itself [se deconstruire]... to lose its construction. And se of se deconstrire which is not the reflexivity of an ego or of a consciousness, bears the whole dilemma.

නලින් සුවාරිස් මෙහිදී වරදවල් දෙකක් කර ඇත.

1. විසංයෝජනය ඉබේ සිදුවන දෙයක් ලෙස අර්ථ ගැන්වීම
2. ඉබේ සිදුවන 'ස්වයං විසංයෝජනය' බුදුදහමේ එන 'සියලු සංස්කාර ධර්ම අනිත්‍යය' යන්න සමග තුල්‍ය කිරීම

අපි නගන ප්‍රශ්නය නම් සුවාරිස් කියන ආකාරයට විසංයෝජනය ඉබේ සිදුවන සිද්ධියක් ද යන්න ය. විසංයෝජනය, පශ්චාත් නූතනවාදය, සාංදෘෂ්ටි කවාදය මෙන්ම ආගම (බුද්ධාගම ද ඇතුළුව) සමග සම්බන්ධ කිරීම තුළ බිහිකර තිබෙන්නේ අවුලකට වඩා වැඩි යමක් නොවේ. ඩෙරීඩා ප්‍රංශ දාර්ශනිකයෙකු ලෙස 1960 ගණන් අග භාගයේ දී ඉදිරිපත් කළ විසංයෝජනය ඇමරිකානු සාහිත්‍ය විචාරයේ තවත් එක් සංකල්පයක් ලෙස ඉංග්‍රීසි භාෂාව කතා කරන රටවල ජනප්‍රිය වූ අතර අපට එය එන්නේ ද පෝල් ඩි මෑන් විසින් දෙන අර්ථය හරහාය. පෝල් ඩි මෑන්ගේ විසංයෝජනය නලින් වැනි භෞතික විද්‍යාඥයන් හා ගණිතඥයන්, සුවාරිස් වැනි හිටපු පූජකයන් තම තමන්ට අවශ්‍ය ආකාරයට ඉදිරිපත් කිරීමට ගොස් අවුල් ජාලාවක් බවට පත්කර ඇත.

ඩෙරීඩා විසංයෝජනය (deconstruction) නම් වචනය ලබා ගන්නේ මාටින් හෙඩගර් ගෙනි. 1927 දී හෙඩගර් විසින් දුන් දේශන පසුව *Basic Problems of Phenomenology* ලෙස මුද්‍රණය වූ අතර මෙහිදී හෙඩගර්ගේ අවධානය දර්ශනයේ ස්වභාවයට විශේෂයෙන්ම එඩ්මන්ඩ් හුසල් විසින් විධිමත්ව ඉදිරිපත් කළ ප්‍රපංච විද්‍යාව වෙත යොමුවෙයි. මෙහිදී හෙඩගර් හුසල්ගේ දාර්ශනික ව්‍යායාමය හඳුනාගන්නේ 'Method of doing Philosophy' එනම් දර්ශනය ක්‍රියාවට නැගීමක් ලෙස ය. මේ විධි ක්‍රමයෙහි පියවරවල් තුනක් ඇත.

1. Reduction (ඌනනය)
2. Construction (ගොඩනැගීම)
3. Destruction (බිඳීම)

මේ පියවරවල් එකිනෙකින් වෙන් කිරීම කළ නොහැකිය. ගොඩනැගීම තුළම බිඳීම ඇත. ගොඩනැගීම තුළ බිඳීම අධ්‍යහාර වේ. හෙඩගර් දාර්ශනික බිඳීමට පාවිච්චි කළ ජර්මන් භාෂාවේ වචනය අපි පරිවර්තනය කරගෙන තිබෙන්නේ 'unbuild' ලෙසය. හෙඩගර් Abbau යන්න යොදගෙන තිබෙන්නේ අද අපි සාමාන්‍යයෙන් destruction, යම් යම් දේවල් එකිනෙකින් වෙන්කිරීම යන අරුත ගෙන දීමට නොවේ.

හෙඩගර් destruction යන්න ඉදිරිපත් කරන්නේ දාර්ශනික ප්‍රශ්නයකට දෙන පිළිතුරක් ලෙසයි. ඔහු මෙහිදී දුන් පිළිතුර වූයේ ඕනෑම දාර්ශනික සාකච්ඡාවක්, අලුතින් ආරම්භ කිරීමට යන රැඩිකල් දාර්ශනික උත්සාහයක් වේවා, සම්ප්‍රදායික සංකල්ප දක්වා පැතිර තිබෙන බව ය. සම්ප්‍රදායික දාර්ශනික ක්ෂිතිජයන්ගෙ

න් ගැළවී අලුතින්ම දෙයක් ඉදිරිපත් කිරීම කළ නොහැකි බව ය. අපට යමක් දාර්ශනිකව විස්තර කිරීමට යාමේ දී දර්ශන ඉතිහාසයේ ඇති සංකල්ප, ක්ෂිතිජයන් හා විධික්‍රමයන් අදාළ කර ගැනීමට සිදුවේ. ඕනෑම ඊනියා නව දෙයක් පැරණි සංකල්පවලින් උපුටා ගෙන ඇත. අපි ලෝකය තේරුම් ගන්නේ භාෂාව හරහා ය. වචන, සංකල්ප අපි උපුටා ගන්නේ අන් අයගෙන්ය. මෙහිදී පැන නැගෙන ප්‍රශ්නය අපට අලුත් දෙයක් බිහි කිරීමට නොහැකි ද යන්න ය. ලෝකය ගැන ඵලදායි ලෙස අපට සිතිය නොහැකි ද? අපට ශූන්‍ය ලක්ෂ්‍යයකින් පටන් ගත නොහැකිය. දෙන ලද සංකල්පවලින්, යෙදුම්වලින් ප්‍රවේශයන්ගෙන් ගැළවී අපට සිතිය නොහැකිය. අපි අනුන්ගෙන් සංකල්ප උපුටා ගන්නේ නම් අලුත් දෙයක් බිහි කරන්නේ කෙසේද යන ගැටළුවය මුණ ගැසේ. මෙයට හෙඩගර් දුන් පිළිතුර වූයේ අපි මෙම සංකල්ප, ක්ෂිතිජයන් හා ප්‍රවේශයන් ඒවාටම එරෙහිව පිහිටුවා එයින් නව නිෂ්පාදනයක් කර ප්‍රකාශයට පත් කරන බව ය.

මෙහිදී උදාහරණයකට ඇරිස්ටෝටල් ආකෘතිය හා ද්‍රව්‍යය (form and matter) සම්බන්ධයෙන් ගෙන එන සාකච්ඡාව දැක්විය හැකිය. මේ ආකෘතිය හා ද්‍රව්‍යය යන යෙදුම් මොනතරම් අපොහොසත්භාවයකින් යුක්ත ද ඒවාට සාරයක් නොමැති බව මෙයින් පෙන්නුම් කෙරෙයි.

ප්‍රශ්නය - මේසය සෑදී ඇත්තේ මොනවාගෙන්ද? එහි ද්‍රව්‍යාත්මක දේ කුමක්ද?

පිළිතුර - ලී

නමුත් මෙහි ලී යනු ආකෘතිමය දෙයකි. ද්‍රව්‍යාත්මක දෙයක් නොවේ. (ග්‍රීක අර්ථයෙන් පරමාණුව Atom යන්නට ලැබෙන්නේ ද්‍රව්‍යාත්මක බවක් නොව 'තවදුරටත් බෙදිය නොහැකි' යන සංකල්පීය ආකෘතිමය අර්ථයකි)

දැන් තවත් ප්‍රශ්නයක් ඇසුවොත්,

ලී සෑදී ඇත්තේ මොනවාගෙන් ද?

එයට ලැබෙන්නේ ආකෘතිමය (form) තේරුමකි. මෙයින් කියවෙන්නේ matter හා form එකිනෙකට එරෙහිව පිහිටුවිය හැකි බවය. ඒවා ගොඩනගා ඇති ආකාරය තුළින්ම බිඳී යයි. ඩෙරීඩියානු අර්ථයෙන් form හා matter විසංයෝජනය කළ හැකිය. මෙහිදී මතක තබා ගත යුත්තේ හෙඩගර්ගේ හා ඩෙරීඩාගේ 'විසංයෝජනය' එකක්ම නොවන බවය. හෙඩගර් එයින් අදහස් කළ දෙයත් ඩෙරීඩා එයින් අදහස් කළ දෙයත් දෙකකි. ඩෙරීඩාට අනුව විසංයෝජනය ආකල්පයකි (attitude). මේ ප්‍රවේශයන් දෙක අතර වෙනස තේරුම් ගැනීමට උදාහරණයක් පැහැදිලි කරමු.

මම යම් දෙයක් සම්බන්ධයෙන් පොතක් ලියනවා යැයි සිතමු. මේ පොත ලිවීමේ දී සාමාන්‍යයෙන් මම කරන්නේ මා තෘප්තිමත් වන තෙක් ලිවීම ය. යම් සම්පූර්ණත්වයක් ලැබෙන තෙක් එම කටයුත්ත කිරීම ය. නමුත් එයින් අදහස් වන්නේ මට කියන්නට අවශ්‍ය සියල්ල එයින් කියවුණා යන්න ද? නමුත් මෙහිදී මතුවන ප්‍රශ්නය වන්නේ එම මාතෘකාව සම්බන්ධයෙන් කීමට තරම් තවත් සැලකිය

යුතු ප්‍රමාණයක් ශේෂගත වීම ය. වැදගත් කාරණා තවම හරියට කියවුණේ නැතැයි මට හැඟී යාම ය. මම පාදක සටහන්, ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය දමන්නේත් යම් සම්පූර්ණත්වයක් බලාපොරොත්තුවෙන් ය. කෙසේ හෝ මම පොත ලියා අවසන් කිරීමෙන් පසු පොත් ප්‍රකාශකයෙකු සොයා ගනිමි. මෙහිදී මම පොතට හැඳින්වීමක් ලියමි. නමුත් හැඳින්වීම විකාරයක් යැයි මට හැඟෙයි. මක්නිසාද හැඳින්වීමෙන් පොතෙන් කියන්නට යන දේ කිව හැකි නම් පොත කුමකට ද? අනෙක් අතට පොත මගින් අවශ්‍ය දේ හරියට කියවී තිබෙනවා නම් අමතර හැඳින්වීමක් කුමකට ද? බොහෝවිට හැඳින්වීමක් වනාහි පොතෙහිම සංක්ෂිප්තයකි. හැඳින්වීම ඉදිරිපත් කරන්නේ ප්‍රධාන කෘතියට අතිරේකයක් (suppliment) ලෙසය. නමුත් හැඳින්වීමේදී යොදන ප්‍රකාශනයන් වන්නේ 'තව කාරණයක් කියන්න තියෙනවා', 'එකම දේ සංක්ෂිප්තව ප්‍රකාශ කිරීමක්' ලෙසයි. මේ අනුව පොත (වියමන) විසංයෝජනයට ආම්පන්න පිටින් ගෙන ඒමට අවශ්‍යතාවක් නැත. වියමනෙහිම ඒවා අන්තර්ගත වී ඇත. නමුත් කවදාවත් හැඳින්වීම තුළ පොත අවශ්‍ය නැතය යන්න නොකිය වේ. එමෙන්ම පොත අර්ථ ශූන්‍ය යැයි කවදාවත් නොකිය වේ. මෙයින් කියවෙන වැදගත්ම කාරණය වන්නේ පොත තුළම එයට පරිපූර්ණ වීමට නොහැකි ලෙස යමක් එළියට ගොස් තිබෙන බව ය. පොත සම්පූර්ණ එකක් ලෙස ඉදිරිපත් වුවත් එයින් යමක් එළියට දමා තිබෙන බව ය. මේ එළියට යාම වියමනේ ව්‍යුහාත්මක ලක්ෂණය වේ (Omission is structural to any text). ලිවීම තුළ මේ එළියට දැමීම ආවශ්‍යයක අංගයකි. මේ ඉවතට දැමීම ඉවත් කළ නොහැකිය. ඕනෑම දෙයක් සම්බන්ධයෙන් ඕනෑම කෙනෙකුට සියල්ල කිව නොහැකි ය. මේ නොහැකියාව භාෂාවේ අපොහොසත් බව නිසා උපන් දෙයක් නොවේ. හැම විට තවත් ටිකක් කියන්න ඉතිරි වීම ව්‍යුහාත්මක ගැටළුවකි.

මම යම් කාරණයක් සම්බන්ධයෙන් පොතක් ලියන්නේ මට කලින් සිටි කතෘගේ අභිලාෂය ඉටුවී නැති නිසා ය. මේ අපොහොසත් බව නිසා මට පොතක් ලිවීමට ඉඩක් සෑදෙයි. මගෙන් පසුව ලියවෙන පොත මගින් මම මගේ පොත තුළ කළ වැරදි පෙන්වා දීමක් සිදුකරයි. අඩුපාඩු පෙන්වා දීමක් සිදුකරයි. ඊළඟ පුද්ගලයාට පොතක් ලිවීමට අවකාශය බිහි කරන්නේ මගේ පොතේ අසම්පූර්ණත්වය ය.

මේ ආකාර විචාරයක් හෝ ප්‍රශ්න කිරීමක් තුළ පොත හෝ වියමන එයට පිටින් තිබෙන විමර්ශකයක් (විශ්ලේෂී දර්ශනයේ දී මෙන්) සමග සම්බන්ධ කිරීමක් නොකරයි. මාගේ මනසට පෙනෙන ආකාරය අනුව පිළිගැනීම (ප්‍රපංච විද්‍යාවේ දී මෙන්) නොකරයි. භෞතික විද්‍යාවේ, ජීව විද්‍යාවේ සහාය නොඉල්ලයි. එය ඕනෑම මොහොතක කළ හැකි විචාරයකි (imminent critique). මෙය තවදුරටත් දෘෂ්ටිවාදී හෝ සදාචාරමය කියවීමක් නොවේ. ඩෙරීඩා හෙඩගර්ගේ කෘති විසංයෝජනය කිරීමේ දී ඔහු කිසිවිටක හෙඩගර්ට තම කෘති මීට වඩා හොඳින් ලියන්නට තිබුණාය ආකාරයේ විවේචනයක් ඉදිරිපත් නොකරයි. විසංයෝජන ප්‍රවේශය

වන්නේ අවසන් සම්පූර්ණත්වයක් බලාපොරොත්තු වීම නොව අනිවාර්යය අසම්පූර්ණත්වය පෙන්වා දීමය. වියමනකින් යමක් යට ගැසී ඇති බව ඩෙරීඩා පෙන්වා දීමේදී එම යට ගැසීම කතෘවරයාගේ වරදක්, නොදැනීමක් නිසා සිදුවී ඇතැයි ඩෙරීඩා නොකියයි. එය වනාහි වියමනේ අධ්‍යහාරමය ලක්ෂණය බව ඔහු කියයි. වියමනෙන් යමක් ඉවත් කිරීම කතුවරයාගේ අභිප්‍රායට පිටතින් සිදුවන දෙයකි. කතුවරයාගේ අභිප්‍රාය ඒ ආකාරයටම ඉටුවීම අනිවාර්යයක් නොවේ. වියමනෙන් කියවී තිබෙන දෙය සහ කතුවරයා කියන්න අදහස් කළ දෙය අතර පරතරයක් බිහිවීම අනිවාර්ය ය.

ඩෙරීඩියානු විසංයෝජනයෙන් තවදුරටත් කියවෙන්නේ වියමනෙන් ඉවත් කළ දෙය වියමන තුළම සලකුණු (traces) වශයෙන් ශේෂ ගත වන බව ය. සංඥාවට කලින් සලකුණු පැමිණෙයි. සලකුණු වියමන තුළම පවතී. සංඥාවේ සද්භාවාත්මක ඒකත්වය සැදෙන්නේ සද්භාවාත්මක ලෙස මතු නොකෙරෙන සලකුණ නිසාය. (The ontological unity of the sign is an effect of the quasi ontological non-presence of the trace). අනෙක් අය කියවෙන දේට යොමුවන විට ඩෙරීඩා නොකියවෙන දෙයටත්, අනෙක් අය අන්තර්ගත කරන දෙය කතා කරන විට ඩෙරීඩා බැහැර කරන දෙයටත්, අනෙක් අය මතු කරන දෙය (presence) කතා කරන විට ඩෙරීඩා යට ගසන (absence) දෙයටත්, අනෙක් අය කතා කරන දෙයට (speaking) යොමු වන විට ඩෙරීඩා නිශ්ශබ්ද වෙන (silence) තැනටත් අනෙක් අය මතකය (memory) ගැන ඉහළට දමන විට ඩෙරීඩා අමතක කෙරෙන (forgetting) දෙයටත් යොමුවෙයි.

මේ අනුව ඩෙරීඩා නව දාර්ශනික ප්‍රවේශයකට හෝ සදාචාරාත්මක ප්‍රශ්නයන්ට ආයාචනා කරනවා නොවේ. එමෙන්ම ඔහු පැරණි දේවධර්මයක් අලුත් එකකින් විස්ථාපනය කරනවා ද නොවේ. පැරණි එකෙහි වැරදි තව එකකින් ඉවත් කරනවා ද නොවේ. ඔහු කරන්නේ අප විසින් කරන බැහැර කිරීම් (omissions) හා අපොහොසත්වීම් (failures) පෙන්වා දී ඒවා හරහා මේ බැහැර කළ දෙයට අපට ඇති සදාචාරාත්මක බැඳීම පෙන්වා දීම ය. එනිසා විසංයෝජනය වියමන් සමග ගනුදෙනු කළත් එය වියමනක් විවේචනය කරන ක්‍රමවේදයක් නොවේ. විසංයෝජනය ආකල්පයක්, සදාචාරාත්මක ආකල්පයක් (ethical attitude) කියන්නේ මේ නිසාය. මේ වචනය ඩෙරීඩා පාවිච්චි කරන්නේ එම්මානුවෙල් ලෙවිනාස්ගේ අර්ථයෙනි. මේ අනුව විසංයෝජනය වනාහි දර්ශන ඉතිහාසයේ එක මොහොතක් ලෙස නම් කළ හැකිය.

අනිමිස ලෝචනයෙන් වියමනක් දෙස බලා සිටීමෙන් හෝ සුවාරිස් කියන ආකාරයට අපවත් වීමෙන් සිදුවන විසංයෝජනයක් හෝ ස්වයං විසංයෝජනයක් නොමැත. විසංයෝජනය සංකල්ප පද්ධතියක් නොවේ. එය වනාහි ශ්‍රමයක් වැය කළ කටයුත්තකි (textual labour=a way of traversing the body of a text). ගසක් දිරා යාම හෝ භෞතික ශරීරයක් බිඳී යාම විසංයෝජනයක් නොවේ. නලින්ට,

ඉම්පිකට හා සුවාරිස්ට මෙන්ම ලංකාවේ බොහොමයක් විවේචකයන්ට වරදින තැනක් මෙහිදී මතුකළ යුතුය.

හර්ඩර් හා විකෝ යන ජර්මානු බුද්ධිමතුන් දෙදෙනා දැනුම සම්බන්ධයෙන් ප්‍රධාන බෙදීම් දෙකක් කළහ.

1. Naturwissenschaft
2. Geisteswissenschaft

මෙහි පළමුවැන්න ඉංග්‍රීසියට පරිවර්තනය වූයේ Natural Science (ස්වභාවික විද්‍යාව) ලෙසයි. එයින් අධ්‍යනයට ලක්වූයේ භෞතික ලෝකය හා එය පාලනයට ලක්කරන නීතීන්ය. දෙවැන්න ඉංග්‍රීසියට පරිවර්තනය වූයේ Spiritual Science (Geist=Spirit) ලෙස ය. එයින් අධ්‍යනයට ලක්වූයේ මනුෂ්‍ය ඉතිහාසය තුළින් නිර්මාණය වූ මානව ලෝකය හා එය පාලනයට ලක්කරන නීතීන්ය. මනුෂ්‍ය දියුණුව හා මනුෂ්‍ය ඉතිහාසය ය. හේගල් තමන්ගේ *Phenomenology of Spirit* කෘතියෙන් ගවේෂණය කළේ ආත්මය එයටම පෙනෙන ආකාරයය (how mind appears to itself). මේ ජර්මානු බුද්ධිමත්තු ලෝක දෙකක් ගැන සඳහන් කළහ. එකකින් matter අධ්‍යනය කෙරෙන විට අනෙකින් මනුෂ්‍ය මානසික ලෝකය අධ්‍යනය කෙරෙයි. ලංකාවේ දී සිදුවූයේ මේ ලෝක දෙක පැටලී යාමයි. මේ නිසාම භෞතික විද්‍යාවෙන් මිනිස් ප්‍රශ්න විසඳීමට යාම, ක්වොන්ටම් භෞතිකයෙන් මාක්ස්වාදය බොරු කිරීමට යාම, බුදුදහම හරහා භෞතික විද්‍යාව තහවුරු කිරීමට යාම, භෞතික විද්‍යාව හරහා බුදුදහම තහවුරු කිරීමට යාම ලංකාවේ දී සිදුවිය. විසංයෝජනය මුන ගැසෙන්නේ මේ වෙනස අහිමි වූ ලාංකික බුද්ධිමතුන්ටය. මේ නිසාම ඔවුන්ට විසංයෝජනයේ ක්ෂේත්‍රය කුමක්ද යන්න අවබෝධ කර ගැනීමට නොහැකි විය.

ඩෙරීඩා පුහුණුව ලැබුවේ දර්ශනය විෂය පිළිබඳවය. ඔහු ප්‍රංශයේ Ecole Normale Suprieure හි ඉගැන්වූයේ දර්ශනය ය. ඔහුගේ පළමු කෘතිය *Edmand Husserl's Origin of Geometry; An Introduction* පළවූයේ 1962 දීය. ඩෙරීඩා මෙහිදී හුසල්ගේ කෙටි වියමනක් වූ The Origin of Geometry පරිවර්තනය කරන අතර එයට හැඳින්වීමක් ලියයි. පසුකාලීනව ඩෙරීඩාගේ ප්‍රථම දාර්ශනික ව්‍යාපෘතිය වන්නේ හුසල්ගේ ප්‍රපංච විද්‍යාවේ සැඟවී ඇති පාරභෞතික පූර්ව උපකල්පනයන් හෙළිදරව් කිරීම ය. එය තුළ තිබෙන්නා වූ ස්වයං-සාම්‍යය පරමාදර්ශී සත්‍යයන් (self-identical ideal truths) හෙළිදරව් කිරීම ය. ප්‍රංශ ඇකඩමික සඟරාවලට ඔහු දාර්ශනික ලිපි ලියන අතර 1967 දී ඔහු *Of Grammatology, Writing and Difference* හා *Speech and Phenomena* යන කෘති ලියයි. *Of Grammatology* කෘතියෙන් ඩෙරීඩා හඳුන්වා දෙන්නේ නව විද්‍යාවකි. මේ විද්‍යාව කුමක්ද? The Science of Writting (ලිවීමේ විද්‍යාව ය). ලංකාවේ විසංයෝජනයේ විකට රූපයන්

බිහිකළවුන් තේරුම් නොගත් විද්‍යාවත් මෙයයි. බුදුදහමේ විසංඛාරය මේ විද්‍යාව සමග කිසිදු සම්බන්ධයක් නැති අතර ත්‍රිපිටකය හෝ භෞතික විද්‍යා සංකල්පයන් හරහා මේ විද්‍යාව නිශ්ඛේධ කළ නොහැකි ය. අයිසෙක් නිව්ටන්ගේ *Principia Mathamatica* ගත්තත්, විට්ගස්ටෙයින්ගේ *Philosophical Investigation* ගත්තත් ලිඛිත ඕනෑම බෞද්ධ සූත්‍රයක් ගත්තත් නාගර්ජුනගේ *මූලමාධ්‍යමික කාරිකාව* ගත්තත්, නලින්ගේ *මගේ ලෝකය* ගත්තත්, මේ විද්‍යාවට එනම් ලිවීමේ විද්‍යාවට යටත් වෙයි. *ලිවීමේ තාක්ෂණය නම් භෞතිකය* අතහැර කිසිදු වියමනක් කළ නොහැකිය. මෙය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

මම වාක්‍යයක් ලියන විටත්, කියවන විටත් එයින් ජනිත කෙරෙන ප්‍රතිඵලය මට පාලනය කළ නොහැකිය. බලාපොරොත්තු විරහිත විවෘත භාවයක් එයට ඇත. මම වාක්‍යයක් ලියන විට වාක්‍යයට සම්බන්ධ විමර්ශකයන්ගෙන් (refererent) වියෝ වීමට සිදුවෙයි. මම ගසක් ගැන ලියන විට වාක්‍යයට 'ගස' නම් විමර්ශකය හෝ ගස නම් දෙය (thing in itself) නොඑයි. මේ නිසා ලිවීම (writting) හා යථාර්ථය (reality) අතර පරතරයක් අනිවාර්යයෙන්ම එයි. මගේ හමෙන් එළියට මාගේ ඇට සැකිල්ලට පැනිය නොහැකිවා සේම ලිවීම තුළ යථාර්ථය එළියට යාම අනිවාර්යය කි. මේ පරතරය කිසිවකින් වසා දැමිය නොහැකි ය. ලිවීම තුළ විමර්ශකය යට යයි. නොපැමිණෙයි (absence). ලිවීම තුළ ඉතිරි වන්නේ හැඟවුම්කාරකයය (signifier). මේ අනුව යමක අනන්‍යතාවය සැදෙන්නේ අනන්‍ය නොවන යමක බලපෑමෙනි. ලිවීමේ පදනම වන්නේ මේ non-presence ය. සංඥාව බිහිකරන්නේ non-presence හරහාය. ශබ්දය බිහිකරන්නේ නිශ්ශබ්දතාවයය. මේ අනුව ඩෙරීඩා කියන්නේ There is no non-grammatological sign යන්නය. වාක්‍යය බිහිවන්නේ ලිවීම තුළ සිදුවන ඉඩ තැබීම (spacing) මගින්ය. මේ අනුව ඉඩ තැබීම ජනනමය (productive, generutive) කටයුත්තකි. ලිවීමට අවකාශමය මෙන්ම කාලමය (spatio-temporal) ව්‍යුහයන් හරහා පියමන් කිරීමට සිදුවෙයි. අර්ථය සංඥාව හරහා ප්‍රකාශ නොවන අතර සංඥාමය නොවන දෙය තුළින් ලැබෙයි. මම වාක්‍යයක් කියවන විට අර්ථය හැමවිටම අත්හිටුවෙයි. අර්ථය ලැබීම පරක්කු වෙයි. එන්න තිබෙන දෙයක් (deferred or still to come) බවට පත්වෙයි. අර්ථය ලබා ගැනීමට මට එක් හැඟවුම්කාරකයකින් තවත් හැඟවුම්කාරකයකට ගමන් කිරීමට සිදුවෙයි. දෙවන හැඟවුම්කාරකය තුළදී කලින් තිබුණු අර්ථය වෙනස් වෙයි. වෙනස තැබීමත්, පරක්කුවත් යන යාන්ත්‍රණය ලිවීමේ ආත්මය වේ. මෙයට ඩෙරීඩා කීවේ play of differance ය. අවකාශය නොතබා වෙනස ස්ථාපනය කළ නොහැකිය. ඩෙරීඩා differance යන නව වචනය හඳුන්වා දෙන්නේ මේ යථාර්ථය පැහැදිලි කිරීමට ය. එම වචනය තුළ differ හා defer යන අර්ථ දෙකම එකවිට නියෝජනය වේ. *Speech and Phenomena* වල ඩෙරීඩා මෙය හඳුන්වන්නේ මෙසේ ය.

The verb 'to differ' (differer) seems to differ from itself. On the one hand, it indicates difference as distinction, inequality, or discernibility; on the other, it express the interposition of delay, the interval of a spacing and temporization that puts off until 'later' what is presently, denied, the possible that is presently impossible. Sometimes the different and sometimes the deferred correspond (in French) to the verb 'to differ'.

මේ යථාර්ථය හැරුණු විට වාක්‍යයක තේරුම පාලනය කරන කේන්ද්‍රයක් නොමැත. *Margins of Pholosophy* වල ඩෙරීඩා තවදුරටත් දක්වන්නේ මේ differance පැවැත්මක් හෝ සාරයක් නොවන බවයි.

Differance is not only irreducible to any ontological or theological-reappropriation, but as the very opening of the space in which ontological - Philosophy-produces its system and its history, it includes ontotheology, inscribing it and exceeding it without return...

මේ differance යන්න හිස්කමක් හෝ බුදුදහමේ කතා කරන ශූන්‍යත්වය නොවේ. විසංයෝජනයෙන් කෙරෙන්නේ වියමනක ගිලී ඇති මේ differance හෙළිදරව් කිරීමය. වියමන ගොඩ නගා ඇත්තේ මේ වෙනස, පරක්කුව සඟවාය. වියමනෙන් එය මකා ඇත. Grammatology නම් විද්‍යාවෙන් කෙරෙන්නේ වියමනේ ඇතුළත, පිටත පෙන්වා දීමය. වියමනක් තවත් වියමන්වලට සම්බන්ධය. එනිසා වියමනක යථාර්ථය texuality යන්නය. වියමනකින් පිටතට පැන වියමන්මය නොවන යථාර්ථයක් සෙවිය නොහැකිය. එළියට පැන්නත් හමුවන්නේ තවත් වියමනකි. නමුත් වියමනක් හැමවිටම උත්සාහ කරන්නේ වියමනෙන් පිටත යථාර්ථයක් ඊනියා වියමන මගින් පෙන්වීමට උත්සාහ ගන්නා බව ය. *Of Grammatology* වල ඩෙරීඩා කියන්නේ *there is nothing outside text* යන්න ය. වියමනෙන් පිටත සාදන්නේත් වියමන මගින්මය *(outside text is made by the text itself)*. මේ අනුව වියමන හා වියමනෙන් පිටත යන්න පාරභෞතිකයකි. ලිවීම තුළ සිදුවන differance යන්නට අමතරව ඩෙරීඩා *spacing, absence, suppliment, archi, ecriture, archi writting, iterability, trace, mark, hymen, pharmakon* ආදී අධෝ ව්‍යුහයන් ගැන කතා කරයි. විසංයෝජනයෙන් කරන්නේ මේවා හෙළිදරව් කිරීම ය. සංස්කාරයන්ගෙන් මිදීමක් හෝ නිවන් ලැබීමක් ගැන මෙහිදී කතා නොකෙරෙයි. නමුත් මේ විසංයෝජනය දේවධර්මයකට හෝ බුද්ධ ධර්මයට සම්බන්ධ කිරීම කොතරම් විහිළුවක් ද? ඩෙරීඩාගේ මේ විද්‍යාව ගැන කතා නොකර නලින්, චම්පික, සුවාරිස් විසංයෝජනයේ විකට රූපයක් ගණනාවක් ඉදිරිපත් කර ඇත.

සුවාරිස් *'ජාක් ඩෙරීඩා ස්වයං විසංයෝජනය වෙයි'* යන ලිපියේ මෙසේ ද ලියයි.

"ඩෙරීඩා *Speech and Phenomena* යන පඨිතයේදී පෙන්වා දෙන්නේ, කෙනෙකු අහම් අසම් (je suis - I am) කියූ සැනින්ම, තමාගේ ආනුභවික පැවැත්මට බාහිරව තම උත්පත්තියටත් පෙර මරණයටත් පසු සදාකාලික පැවැත්මක් ඇතැයි යන අභිමානය ජනිත වන බවත්, එය ජීවිතය නිරන්තරයෙන් වෙනස් වන්නක් ද ජරාවට පත්වෙමින් මරණය කරා ගලා යන පැවැත්මක් ලෙස හිතුවක්කාර අන්දමින් ප්‍රතික්ෂේප කරන්නක් ද බවය."

සුවාරිස් *'ඩෙරීඩාගේ විසංයෝජන රීතිය සහ බුදුන්ගේ අනන්තවාදය සමාජ විවේචනයක් ලෙස'* ලිපියේ මෙසේ කියයි.

"මිනිස්සු මැරෙනවා, අපි වයසට යනවා, අපිට ලෙඩ හැදෙනවා, බුදුහාමුදුරුවොා පාවිච්චි කළා 'විසංඛාර' (desconstruction) කියන වචනය. 'විසංඛාර ගතං චිත්තං' විසංඛාර වූ සිත. හිතෙන් හදපු දේවල් තමයි එතුමා අනාවරණය කළේ. හෙළිදරව් කෙරුවේ. විසඳුවේ."

මෙතනින් ඩෙරීඩා හා බුදුන් අතර සාම්‍යයක් බිහිවේද? ඩෙරීඩා *Speech and Phenomena* කෘතිය තුළ කරන විසංයෝජනමය කාර්යය බුදුදහමේ අනාත්මවාදය තහවුරු කර ගැනීමට පාවිච්චි කිරීම තුළ බිහිවන්නේ විසංයෝජනයේ විකට රූපයකි.

ඩෙරීඩාගේ භාෂාව පිළිබඳ දර්ශනවාදී න්‍යාය ගොඩනැගෙන්නේ භාෂාව පිළිබඳ එඩ්මන්ඩ් හුසල්ගේ ප්‍රපංච විද්‍යාත්මක න්‍යාය විසංයෝජනය කිරීමෙන්ය. හුසල් භාෂාවේ 'සත්‍ය' රූපය දෙස බලන්නේ ආත්ම කේන්ද්‍රීය දාර්ශනිකයෙකු 'I-Philosopher' දෘෂ්ටිකෝණයෙනි. ඔහුට අනුව සත්‍ය භාෂාව අවශ්‍යයෙන්ම 'මානව' එකකි. හුසල් පැමිණි නිගමනය නම් සත්‍ය භාෂාව ප්‍රකාශමාන (expressive) එකක් වන අතර එය භාෂාව උච්චාරණය කරන්නාගේ අභිමතාර්ථය (will and intention) ප්‍රකාශ කෙරෙන්නක් බවයි. ප්‍රකාශමානය පවතින්නේ යම් පුද්ගල මනසක් සිතමින් වචන එළියට දමන මොහොතේදීය. හුසල් සත්‍ය භාෂාව අභිමතාර්ථයන් සහිත (intention) එකක් ලෙස ගනු ලැබුවේ එනිසාය. භාෂාවේ වචන නිසා මනසට සිදුවන්නේ ඒ වචන පිළිගන්නා ලාභියෙකු (receiver) වීමටය. සාමාන්‍යයෙන් ව්‍යුහවාදය යටතේ අප දන්නා පාඨම නම් භෞතික හැඟ වුම්කාරකයක් සමග හැඟවුම එකම කාසියක දෙපැත්ත මෙන් සම්බන්ධව සිටින බවයි. නමුත් හුසල් කියා සිටියේ හැඟවුම්කරණය සමග විඥානමය ක්‍රියාව සම්බන්ධ බව ය. මේ න්‍යාය හරහා හුසල් 'voice' යන්න හඳුන්වා

දිමක් කරයි. එහිදී ඔහු කියන්නේ පුද්ගලයෙක් හා පුද්ගලයෙක් අතර කථනයේදී සිදුවන්නේ කථකයා අසන්නා ඉදිරියේ සෘජුව පෙනී සිටීම ය. සවිඥානකව ඔහු මැදිහත් වීම ය. එවන් තත්ත්වයක් තුළ වචන පිටුපස ඇති අර්ථ කථකයා හා අසන්නා පාලනය කරයි. මේ නිසා එවන් සංවාදයකදී මෙවැනි වාක්‍ය කියවෙයි. 'නෑ මම අදහස් කළේ මෙයයි.... ආදී වශයෙන්. නමුත් හුසල් මෙයින් නැවතුණෙ නැත. මෙම පුද්ගලාන්තර කථනය පමණක් නොව පුද්ගලයෙකු තුළත් කථනයක් සිදුවන බව (intra-subjective use of voice) (interior monologue) දැක්වීය. භෞතික මාධ්‍යයක් නැතිව, එළියේ අවකාශය හරහා වචන ගමන් කරන්නේ නැතිව එකම පුද්ගලයෙකු අභ්‍යන්තරය දෙකට බෙදී අභ්‍යන්තර ශබ්දය (inword voice) උච්චාරණයක් ලෙස හා එයම පිළිගන්නෙකු වශයෙන් ක්‍රියාත්මක වේ. මෙය ඩෙරීඩා තමන්ගේ *Speech and Phenomena* වල සඳහන් කරන්නේ මෙලෙසය.

My words are 'alive' because they seem not to leave me; not to fall outside me, outside my breath, at a visible distance; not to cease to belong to me, to be at my disposition 'without further props'

මේ අනුව මේ අභ්‍යන්තරික ශබ්දය කාලය තුළ සිදුවන්නක් විනා අවකාශය තුළ සිදුවන්නක් නොවේ. හුසල් දක්වන අභ්‍යන්තර ආත්ම භාෂණය (interior monologue) තුළ ඇති විශේෂත්වය නම් කථකයා තමන් කියන්නට යන දේ සම්බන්ධයෙන් කථනයට කලින් සිටම පූර්ණ වශයෙන් දැනුවත්ව සිටීමයි. මෙහිදී සිදුවන්නේ මනස පලු දෙකකට බෙදාගෙන කථකයා හා ලාභියා වශයෙන් එය වචනයට පෙරළීමට කලින් සිටම තමන් කියන්නට යන දෙය ගැන දැනුවත්ව සිටීමය. මෙයින් හුසල් ආ නිගමනය වූයේ සත්‍ය භාෂාව අවශ්‍යයෙන්ම මානව එකක් බවයි. හුසල් වාස්තවිකව පවත්නා සංඥාවේ පැවැත්ම ආත්මීය මානව අදහස් හරහා විස්ථාපනය කර දැමුවේය.

ඩෙරීඩා හුසල්ගේ ඉහත ප්‍රපංච විද්‍යාත්මක අදහස විසංයෝජනය කරන්නේ කෙසේද? ඔහු පවසන්නේ 'සත්‍ය' භාෂාව වනාහි වඩාත් 'මානව' භාෂාව නොවන බවයි. සත්‍ය භාෂාව ස්වයංපෝෂිත (self-sufficient) එකක් විය යුතු බව ඔහු කියයි. මිනිසා නොමැති තැනකත් එය ක්‍රියාවෙහි යෙදිය යුතුය. යමෙකුගේ අභිලාෂයෙන් තොරවත් එය ක්‍රියාත්මක විය යුතුය. සත්‍ය භාෂාව 'ලිවීමේ' නීතියට යටත් විය යුතුය. ස්වයංපෝෂිත එකක් වන්නේ ලියන ලද භාෂාවකි. එවන් භාෂාවක් එහි ස්වාමිත්වයෙන් ගැළවී ක්‍රියාවෙහි යෙදෙයි. එවන් භාෂාවක් විඥානයක මැදිහත්වීමක් නොමැතිව ක්‍රියාවේ යෙදෙයි.

ඩෙරීඩා මේ ප්‍රශ්නයට ප්‍රවේශ වන්නේ අපගේ සාමාන්‍ය දැක්ම උඩුයටිකුරු කරමිනි. ඔහු ඉදිරියට ගන්නේ ලිවීමේ ඇති ප්‍රාථමිකත්වය ය. යමෙකුට ශබ්දය

(voice) ප්‍රමුඛ කරමින් එය මිනිස් ඉතිහාසය තුළ ලිවීමට කලින් පැමිණි බවට තර්ක කළ හැකි ය. ළමයෙකු සැලකුවහොත් ඔහු හෝ ඇය ලිවීමට කලින් කථනය එළියට දමන බවට අපි තර්ක කරමු. නමුත් ඩෙරීඩාට අනුව වැදගත් වන්නේ ඓතිහාසික වශයෙන් වඩාත් ප්‍රාථමික වන්නේ කුමක්ද යන්න නොවේ. ලිවීම නම් කාරණය (fact) කථනය නම් කාරණය අනුව ඓතිහාසිකව සිදුවුවත් කථනය නම් අදහස (idea) ලිවීම නම් අදහස මත පදනම් වන බව ය. මෙහිදී කියවෙන්නේ ලිවීම තාර්කික වශයෙන් කථනයට වඩා ප්‍රාථමික වන බව ය. අපගේ සාමාන්‍ය චින්තනය සෑදෙන්නේ ඕනෑම දෙයක ප්‍රාථමික අවධිය යම් කේන්ද්‍රයක සිට විකාශනය වන ආකාරයට ය. ගසක් ගත්තොත් එය කේන්ද්‍රීය බීජයකින් හටගන්නා බව පෙනෙයි. සැඟවුණු හේතුව මෙය ය. මේ උත්පත්තිය පිළිබඳව ඩෙරීඩාගේ දැක්ම සම්ප්‍රදායික අදහසට වඩා වෙනස් ය. හුසල් පවසන්නේ වචනමය අර්ථයට වඩා මානසිකමය අර්ථය ප්‍රාථමික වන බව ය. උච්චාරකයාගේ මනස අර්ථයන්ගේ කේන්ද්‍රය වන බව ය. එය ප්‍රාථමික ය. එය අර්ථයේ උත්පත්තිය ය. ඩෙරීඩා සම්පූර්ණයෙන් බැහැර කරන්නේ මේ තර්කය ය. ඩෙරීඩා කියන්නේ ලේඛකයාගේ මනසේ තිබෙන දෙය වචනවල අර්ථය සෑදීමට හේතුවක් වෙන්නේ නැති බවයි. අර්ථ සෑදෙන්නේ ලිවීමේ විද්‍යාවට (Grammatology) අනුකූලවය. වචනයකින් තවත් වචනයකටත්, ඊළඟ වචනයටත් වශයෙන් යාමේදී කලින් තිබුණු අර්ථය නවීකරණය වෙමින් නව අර්ථ සෑදෙනවා විනා පරිපූර්ණ අර්ථයක් යනුවෙන් දෙයක් සෑදෙන්නේ නැත. මම අදහස් කළ දෙයට වඩා වෙනස් දෙයක් හැඟවුම්කාරකය කියයි. ලිවීමේ විද්‍යාවේ සංඝටකයක් වන *materiality, absence, repeatability, spacing* යන ආදියට යටත් වීමෙන් තොරව කිසිවක් ලිවිය නොහැකිය. එපමණක් නොව මේවාට යටත් නොවී කථනයන්ට හෝ භාෂාවට ද පැවැත්මක් නොමැත. මේ ප්‍රවේශය නිසා භාෂාව පිළිබඳ හුසර්ලියානු ප්‍රපංච විද්‍යාත්මක අදහස පමණක් නොව භාෂාව පිළිබඳ සෝෂරියානු අදහස ද විසංයෝජනය කළ හැකි ය. නමුත් එය ඉබේ විසංයෝජනය වන්නේ නැත.

ඩෙරීඩාගේ බැහැර කිරීමට ලක්වන්නේ හේගල්, හුසල් හා හෙඩගර් ඇතුළුව සමස්ත බටහිර දර්ශනයේම ප්‍රකාශයට පත්වූ පාරභෞතික ඉතිහාසයකි. එම ඉතිහාසය එක වචනයකින් දැක්වුවොත් *Writting and Difference* වල දක්වන ආකාරයට *'history of presence'* ය. පැමිණ වීමේ පාරභෞතිකයේ ඉතිහාසය ය. ඩෙරීඩා හුසල්ට එරෙහිව විචාරයක් ගෙන එන්නේ විඥානයේ ස්වයං පැමිණ වීමට *(the self-presence of consciousness)* එරෙහිව ය. ඩෙකාට්ස්ගේ සිට හුසල් දක්වා ප්‍රකාශයට පත්වුණේ මේ පාරභෞතික බව ඩෙරීඩාගේ අදහස ය.

ලිඛිත භාෂාවට දෙවන ගණයේ තැන දීමේ හුසලියානු ප්‍රවේශය බටහිර සංස්කෘතිය පුරාම තිබුණු බව ඩෙරීඩා පෙන්වා දෙයි. ප්ලේටෝගේ Phaedras වල පූර්ණ කථනයට *(full speech)* එයින් ගම්‍ය වන ලිවීමට *(derivative writting)* වඩා ප්‍රමුඛස්ථානයක් ලබාදී ඇති බව පෙන්වයි. ඩෙරීඩා මෙය නම් කරන්නේ

'phonocentrism හෝ logocentrism කියාය. හුසල් පිළිගත් වාගීශ්වරත්වය වූයේ අර්ථයේ උත්පත්තිය මිනිස් ආත්මීයත්වය බව ය. බටහිර පාරභෞතික සම්ප්‍රදාය දිගින් දිගටම කථන වචනයට ප්‍රමුඛස්ථානය දීම ඩෙරීඩා දකින්නේ වාග් කේන්ද්‍රීයත්වයේ යුගය (*the epoch of the logos*) ලෙසය. එය *the metaphysics of the phonetic writting, phonologism, phallocentrism, phallogocentrism* ආදී විවිධ නම්වලින් හඳුන්වා ඇත. එය පැමිණ වීමේ දේවධර්මයකි (Ontotheology). මේ වාගීශ්වරත්වයන්, පැමිණ වීමේ පාරභෞතිකයන් ඉක්මවා යාමට ඩෙරීඩා ඉදිරිපත් කරන ක්‍රමවේදය විසංයෝජනය ය. නමුත් මෙය සම්ප්‍රදායික අර්ථයෙන් දාර්ශනික විධි ක්‍රමයක් නොවේ. හෙඩගර් destruction (abbau) යන්න තමන්ගේ *Being and Time* කෘතියේ පාවිච්චි කරන්නේ අර්ථකථනවේදී උපකරණයක් (hermeneutic tool) ලෙස ය. අර්ථයන්හි මූල සම්භවය සෙවීමට එය යෙදවේ. හෙඩගර්ට අනුව destruction වලට ප්‍රතිජානනමය අර්ථයක් ඇත. ඩෙරීඩා Writting and Difference වල දකින ආකාරයට නීට්ෂේ විසින් පාවිච්චිය කළ *overcoming,reversal* යන පාවිච්චි තුළත් පාරභෞතික විවේචනය කිරීමේ ස්වභාවයක් පැවතිණි.

නලින් සුවාරිස් විසංයෝජනය ඉබේ සිදුවන දෙයක් ලෙස ගැනීම ඩෙරීඩාගේ කිසිදු න්‍යායාත්මක ඉදිරිපත් කිරීමක් සමග එකඟ වන්නේ නැත. ඩෙරීඩා විසංයෝජනය දකින්නේ ක්‍රියාකාරී මැදිහත් වීමක් (active intervention) ලෙසය. අපගේ සංස්කෘතිය ගොඩනගා තිබෙන වියමනට මැදිහත්වීමකි. මෙය වියමනක් බිඳ දමන සුළු කියවීමකි. (destructive reading) මෙය වියමනක් පිටත සිට කරන බිඳ දැමීමක් නොව වියමන තුළම තිබෙන සංඝටකයක් ආශ්‍රයෙන් කරන බිඳ දැමීමකි. ඩෙරීඩා *inhabit, subverting* යන වචන පාවිච්චි කරන්නේ එනිසාය. ඩෙරීඩා විසින් විසංයෝජනය වියමන්වලට ක්‍රියාකාරී මැදිහත්වීමක් ලෙස දක්වන අතර එහිදී පිටින් සංකල්ප හෝ ආම්පන්න නොගන්නා නිසා Memories For Paul de Man ලියවිල්ලේ මෙසේ දක්වයි.

> there is always already deconstruction, at work in works, especially in literacy works. Deconstruction cannot be applied, after the fact and form the outside, as a technical instrument of modernity. Texts deconstruct themselves by themselves.

වියමන බිඳීමට අදාළ කර ගන්නේ වියමන තුළ තිබෙන ගොඩ නැගීමමය. විසංයෝජනය ඒ තුළම තිබෙනවා යැයි ගැනෙන්නේ ඒ නිසාය. විසංයෝජනයට එහිම කියා අන්තර්ගතයක් මේ නිසාම නොමැත. *Hospitality, Justice and Responsibility* නම් සම්මන්ත්‍රණයෙන් ඩෙරීඩා කීවේ විසංයෝජනය කිසිම දෙයක් ඉදිරිපත් නොකරන අතර එය දුගීමය දෙයක් (poor thing) යන්නයි. මේ නිසා විසංයෝජනය යම් දෙයක් වශයෙන් ගෙන විවේචනයට ලක් කිරීම කළ නොහැකිය.

හෙඩගර්ගේ අර්ථයෙන් *(art) work* වුවත් ව්‍යුහවාදී අර්ථයෙන් *'text'* එකක් වුවත් ඒවා සෑදී ඇත්තේ එකම භෞතිකයකින් (play of differnce) බව ඩෙරීඩා පවසයි. වියමනක් පොතක් ම විය යුතු නැත. ප්‍රංශ විප්ලවය වැනි සිද්ධියක් පවා වියමනකි. නමුත් ඕනෑම වියමනක් එහි අපේක්ෂිත අභිලාෂයන් හා එම වියමනට අදාළ සන්දර්භයෙන් එළියට පනියි. අතිරික්ත අර්ථ බිහිකරයි. මේ වියමනට පිටින් කිසිවක් නැත (there is no outside text). වියමනට පිටතක් නැත. මේ නිසා වියමන හා දෙය වශයෙන් ප්‍රවර්ග දෙකක් හඳුනා ගැනීම පාරභෞතිකමය වේ. අනාගත අර්ථකථනයන්ට ඕනෑම වියමනක් විවෘතය.

හුසල්ගේ *Logical Investigation* කෘතිය ප්‍රශ්න කරමින් ඩෙරීඩා *Speech and Phenomena* ලියයි. මෙහිදී හුසල් පෙනී සිටීමේ පාරභෞතිකයක හා වාගීෂ්වරත්වයක හිරවී සිටින බව ඩෙරීඩා පෙන්වා දෙයි. ඩෙරීඩා ලිවීමට (ecriture) ප්‍රමුඛ තැන දෙමින් ආත්මයේ මැදිහත්වීමක් නොමැතිව අර්ථ ගොඩ නැගෙන බව පෙන්වා දෙයි. අදහසක් ඉදිරිපත් වීම ප්‍රතිභානයක් ඉෂ්ට වීමක් ලෙස හුසල් ගැනීමේදී ඔහු ස්වයං-සාම්‍යය පරමාදර්ශයකට (self-identical ideal) යටවී ඇත. මෙවන් අනුභූති උත්තර හැඟවුමක් නොමැතිව භාෂාව ක්‍රියාත්මක වන බව ඩෙරීඩා දක්වයි (*language preserves the difference that preserves language*). නමුත් හුසල්ගේ ප්‍රපංච විද්‍යාව තවදුරටත් විශ්ලේෂණය කළ නොහැකි පාරභෞතික පූර්ව උපකල්පනයක් මත පදනම් වී ඇත. එය වනාහි අනුභූතිඋත්තර ජීවිතයේ ස්වයං ඉදීමය (*the self-presence of transcended life*). සියලු අර්ථ සැකසෙන්නේ අනුභූතිඋත්තර ආත්මයට (*transcendential ego*) අනුකූලව. මේ ස්වයං ඉදීම මරණයෙන් පසුවත් නොනැසී පවතිනවා යන්න හෙඩගර් හා ඩෙරීඩා වැනි අය එක් නිගමනයකට පැමිණීමටත්, සුවාරිස් තවත් නිගමනයකට පැමිණීමටත් හේතුවී ඇත.

හෙඩගර් කීවේ සත්තාව යනු කාලය බවයි (*being is time*). මනුෂ්‍ය සත්තාව උපත හා මරණය අතර තාවකාලිකව විහිදී ඇත (*Being is time and time is finite; it comes to an end with our death*). අපගේ ජීවිතය අපගේ මරණය නම් ක්ෂිතිජය වෙත ප්‍රක්ෂේපනය වී ඇත (*we constantly project our lives on to the horizon of our death*). මෙයට හෙඩගර් දුන් නාමය වූයේ "*being-towards-death*" ය.

හුසල් අනුභූතිඋත්තර ආත්මය මරණයෙන් පසුවත් පවතිනවා යැයි කීවේ පෙරදිග ආගම්වල අවධාරණය කරන ආකාරයේ ආත්මයේ සංසාර ගමනක් ඇතැයි යන්න ඔප්පු කිරීමට නොවේ. අපි මැරුණත් මිනිස් ආත්මීයත්වය අර්ථ සම්පාදනයේදී දිගින් දිගට ඉටු කරන කාර්යය පෙන්වා දීමටය. හුසල් තහවුරු කරන ආත්මය එකක් වන අතර සුවාරිස් කතා කරන ආත්මය වෙනෙකකි. ඩෙරීඩා විසංයෝජනය කරන්නේ හුසල් විසින් කරන විග්‍රහයේ ස්වයං පැමිණීමයි (*self-presence in consciousness*). ඩෙරීඩා දකින ආකාරයට හුසල් විඥානය ලෙස ගන්නේ *'consciousness' means nothing other than the possibility of the*

self-presence of the present in the living present.' ඩෙරීඩා මරණය ගන්නේ සදාකාලික අමරණීයත්වයක් නැතැයි කීමට නොවේ. ලේඛකයාගේ මරණයෙන් පසුවත් 'ලිවීමක්'හෞතික වන බව පෙන්වීමට ය.නමුත් කථනයක් ක්‍රියාත්මක වන්නේ කථකයා ජීවමානව සිටින මොහොතේ පමණි.හුසල්ට අනුව ආත්මයක් ලිවීමේ මූලධර්මයට යටත් ය. එය *a process of differnce* ය. වචනයට පෙර එන ආත්මීයත්වයක් නැත. ජීවිතය නම් පැමිණීම එන්නේ මරණය නම් නොපැමිණීම (absence) හරහා ය. හුසල්ට අනුව පරම සත්තාව වන්නේ වර්තමානය තුළ ඉඳීමය (prence of the present). එය මගේ අනුභූතික පැවැත්ම, සිද්ධිවාචක බව (factuality), අහඹු බව, ලෞකික බව ඉක්මවා යයි. මේ ඉඳීම සාර්වත්‍රික එකක් වන නිසා හුසල් අතින් අමරණීයත්වය වැනි දෙයක් කියවේ. මාගේ අනුභූතික පැවැත්මට ඔබ්බෙන් මගේ උපතට කලින් මෙන්ම මරණයට පසුවත් වර්තමානයක් ඇත (the present). නමුත් ඩෙරීඩා කියන්නේ මරණය (my disapperence) නිසා මාගේ ඉඳීම හා පුනරාවර්තනය/පුනරුත්පත්තිය (repetition) සෑදෙන බවයි. මේ අනුව සංඥාව මරණය හරහා උපදී. ඩෙරීඩා කියන්නේ මාව ඇති කරන්නේ මාගේ මරණය බව යි.

The appearing of the I to itself in the I am is thus originally a relation with its own possible disappearance. Therefore, I am originally means I am mortal.

මම යන්න උච්චාරණය කිරීමට මගේ මරණය ව්‍යුහාත්මකව අවශ්‍යය.

මේ ආකාරයෙන් ඩෙරීඩා සදාකාලික පැවැත්මට එරෙහිව තර්ක කරන්නේ ඩෙකාට්ස්ගෙන් පටන් ගත් cogito ව සහ පසුව හුසල් අතින් වර්ධනය වන trancendental ego විසංයෝජනය කිරීමේ අරමුණෙන් විනා බුදු දහමේ සඳහන් කරන අනාත්මවාදයක් තහවුරු කිරීමේ අරමුණෙන් නොවේ. නමුත් සුවාරිස් තමන්ගේ ඩිකන්ස්ට්‍රක්ෂන් හෙවත් විසංඛාර කිරීම නම් ප්‍රවාද ලිපිය අවසන මෙසේ කියයි.

> "ඩෙරීඩා බුද්ධ ධර්මය හරියට නොදන්නා නිසා ඉන්දියාවේ හැම දර්ශනයක්ම ලොගෝ කේන්ද්‍රීය කියලා හිතුවා. (බුද්ධාගම මම හිතන්නේ ලෝගෝ කේන්ද්‍රීය වෙලා ඇත්තේ පිරිමි ආධිපත්‍යය නිසා)"

ලංකාවේ සමහර බෞද්ධයන් කීමට උත්සාහ ගත්තේ මාක්ස්වාදී විවේචනයෙන් බුදු දහම නිදහස් බව ය. සුවාරිස් කියන්නේ ඩෙරීඩියානු වාගීශ්වර විරෝධයෙන් බුදු දහම නිදහස් බව ය. මාක්ස්, ඩෙරීඩා බුදු දහම ඉගෙන ගත්තා නම්, වෙනත් දෙයක් කියන්න තිබුණු බව ය. නමුත් බුදු දහම දන්නවා යැයි කියන සුවාරිස් වැනි මහතුන් තමන්ගෙ *Buddha's Way* කෘතිය ඩෙරීඩාට යවා සහතික ලබා ගැනීමට උත්සාහ ගෙන ඇත. නලින්, චම්පික, සුවාරිස් වැනි කිසිවෙක් හේගල්ව නොදැනීම මේ අවුලට එක් හේතුවකි. හේගල් කලාව හා ආගමට ඉහළින් දර්ශනය තබයි. දර්ශනයෙන් ආගම සංකල්ප ගත කර ගත හැකි විනා බුද්ධාගම ඇතුළු කිසිම ආගමකින් දර්ශනය සංකල්ප ගත කරගත නොහැකිය. ඩෙරීඩියානු

විසංයෝජනයෙන් බෞද්ධ ග්‍රන්ථ විසංයෝජනය කළ හැකි නමුත් බුද්ධාගමෙන් විසංයෝජනය තේරුම් ගත නොහැකිය.

සුවාරිස් තමන්ගේ 'ඩෙරීඩාගේ ඩීකන්ස්ට්‍රක්ෂන්' ලිපියෙහි ආත්මීයත්වය හා ලිංගිකත්වය සම්බන්ධයෙන් නොමග යවන සුළු අදහස් ගණනාවක් දක්වා ඇත. මේ අදහස් ඩෙරීඩියානු අදහස් ලෙස දැක්වුවත් ඒවා ඩෙරීඩාගේ නොව තමන්ගේ මනස්ගාත බව පෙනෙයි. මේ හරහාද තහවුරු වී තිබෙන්නේ විසංයෝජනයේ විකට රූපයකි. ඔහු තමන්ගේ වියමනේ මෙසේ දක්වයි.

"සංසර්ගයෙන් ශුක්‍රාණු යෝනිය ඇතුළේ අතුරුදහන් වුණාම, ගැහැනියක් තුළ යමක් පටන් ගැනෙනවා. පිරිමියාගේ කාර්යය තත්පරවලින් ගණන් කරන්න පුළුවන්..... ගැහැනු පිරිමි ජීවය උරාගෙන 'මහ කඩුව' පිටකරන්නේ අඩපණ පණුවෙක් වගේ. ස්පාඤ්ඤ භාෂාවෙන්-පොකෝ මූර්ත- (Poco Muerte) පුංචි මරණය කියන්නේ මේකටයි. සුරාන්තයෙන් පස්සේ වෙන්නේ ඉදිමිච්ච ඔළු ගෙඩිය ආපසු ඇකිලීම, අඩපණ වීම, ගොරව ගොරවා නින්දට වැටීම. ගැහැනිය තුළ ආරම්භයක්. ඩෙරීඩා කියන්නේ ගැහැනිය යට කරලා ගැහැනිය උඩ වේගවත්ව ක්‍රියා කරන (active) පිරිමියා අන්තිමට තමාගේ දාසියගේ වහලා වෙනවා කියලා. පිරිමියෙක් ගැහැනියක් සමග සංසර්ගයේ යෙදුනාට පසු ඔහු ආරක්ෂා කරගත් ශරීරය මමත්වය, ස්වාධීනත්වය මැකී යනවා. ශාරීරික සීමා (තිරය) අතුරුදහන් වෙනවා. ඒක මාංශයක් වෙනවා. ඇතුළතට ගත් දෙය ගැනි තියා ගන්නවා. ඩෙරීඩා කියන්නේ ප්ලේටෝ සිට හේගල් දක්වා පරාරෝපණ මූලධර්මය (Theory of Aienation) අදහස් කරන්නේ මෙයයි කියලා."

සුවාරිස්ගේ මේ අදහස් දැක්වීම තුළින් පෙනෙන දෙයක් වන්නේ ලිංගිකත්වය ශාරීරික හා ජීව විද්‍යාත්මක එකක් බවට පත් කිරීමට ගන්නා උත්සාහය ය. සුවාරිස්ගේ අදහස තවදුරටත් විකාශනය කළොත් ඔහු නතර වන්නේ ලිංගිකත්වය සම්පූර්ණයෙන් පරිණාමීය ජීව විද්‍යාත්මක එකක් බවට පත් කළ ඩෙස්මන්ඩ් මොරිස් ළඟ ය. අපි දැන් මොරිස්ව උපුටා දක්වමු.

"පූර්ව සංසර්ග අවස්ථාව සමග සසඳන විට සංසර්ගීය අවස්ථාවට ගත වන්නේ ඉතා කෙටි කාලයකි. වුවමනාවෙන්ම ප්‍රමාද කිරීමේ උපක්‍රමයක් නොයෙදුවොත් පුරුෂයාගේ ශුක්‍රාණු විසර්ජක පරිපූර්ණ ක්‍රියාව මිනිත්තු කීපයකදී සිදුවෙයි. අනෙකුත් ආශ්‍රෙයන්ගේ ගැහැනු සතුන් ලිංගික ක්‍රියාවේදී උච්චාවස්ථාවකට පත් නොවන නමුත් නිරුවත් වානරයා මේ අතින් අසාමාන්‍ය වේ. දීර්ඝ වේලාවක් පුරුෂයාට සංසර්ගයේ යෙදිය හැකි නම්, අවසානයේදී ස්ත්‍රිය ද කායික අතින් පුරුෂයාට සමාන වන ප්‍රබල උද්වේගකර අත්දැකීමක් සහිත පරිපූර්ණ අවස්ථාවකට පත්වෙයි. වෙනසකට ඇත්තේ ශුක්‍රාණු පහ නොවීම පමණි.

පූර්ව සංසර්ග උත්තේජනය වැඩි කිරීමෙන් හෝ තමා උච්ච අවස්ථාවකට පත්වීම පමා කිරීමෙන් හෝ ශුකාණු නිකුත් කිරීමෙන් පසුව නැවත වරක් සංසර්ගයේ යෙදීමෙන් හෝ පුරුෂයාට මෙම ප්‍රශ්නය විසඳිය හැකි බව සඳහන් කිරීම මෙහිදී ප්‍රමාණවත්ය. ඔහු මඳ වේලාවක් විවේක ගෙන නැවත සංසර්ගයේ යෙදුණොත් අඩු වූ රාගික ශක්තිය හේතු කොට ගෙන ඔහු උච්චස්ථානයට පැමිණීමට වැඩි වේලාවක් ගත වන බැවින් ස්ත්‍රියට එම තත්ත්වයට පැමිණීමට අවශ්‍ය තරම් කාලය ලැබෙනු ඇත. දෙදෙනාම මෙසේ උච්ඡස්ථාවට පැමිණීමෙන් පසුව සාමාන්‍යයෙන් විඩාවට පත්ව විවේක ගනිමින් නින්දට වැටෙත්."

-ඩෙස්මන්ඩ් මොරිස්, නිරුවත් වානරයා, 1984, පිටු 50-51-

ඩෙස්මන්ඩ් මොරිස් කියන්නේත් පිරිමියාට පුරුෂත්වය කෙළින් තියා ගැනීමට ශුකාණු පහ නොකර එය ස්ත්‍රියට බාර නොදී සිටීමේ ක්‍රමවේදයක් පිළිබඳවය. ශාරීරික සීමා තිරය අතුරුදහන් නොවීමට වග බලා ගැනීමක් පිළිබඳවය. මේ දෙදෙනාම ලිංගිකත්වයේ විශාල පාර්ශවයක් ශරීරවලට හා ශුකාණුවලට බාරදී ඇත. මොරිස්ගෙන් වෙනස්ව සුවාරිස් පිරිමියෙකුගේ ශුකාණු පහවීමෙන් පසු ඔහුගේ ආත්මය අහෝසි වී යන බව හා විසංයෝජනය වී යන බව පවසයි.

ලිංගිකත්වය තුළ දෙදෙනාට ම තෘප්තිය ලබා ගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳ ව මොරිස්ටත්, තමා යන හැඟීම මොහොතකට නතර කර ගැනීමේ ක්‍රමවේදයක් පිළිබඳ ව සුවාරිස්ටත් ලබා ගැනීමට අවශ්‍ය නම් ඔවුන් දෙදෙනාම යා යුත්තේ තන්ත්‍රයානයට ය. මොරිස් බුදුදහමට ගිය කෙනෙක් නොවේ. නමුත් සුවාරිස්ට තන්ත්‍රයානය තුළින් දේවධර්මයෙන් නොලැබුණු විමුක්තියක් ලබා ගත හැකි ය. භගවාන් ශ්‍රී රාජනිෂ්ගේ 'තන්ත්‍ර හා නිම්න සංතෘප්තිය' පොත පරිවර්තනය කළ ඩබ්.එම්. ගුණතිලක මෙසේ දක්වා ඇත.

"කාම ක්‍රීඩාව තුළදී තමා යන හැඟීම මොහොතකට නැතිවී යයි. තමා යන හැඟීම දැඩිව අල්ලා ගත් පුද්ගලයෝ සියලු දෙනා කාමයට විරුද්ධ වෙති. ඊට හේතුව නම් කාම ක්‍රීඩාව තුළදී ඔවුන්ගේ තමා යන හැඟීම නැතිවී යාමය. එම අවස්ථාවේදී ඔබ ද නැත. අනෙකාද නැත. අනෙක් තැනැත්තාත් ඔබත් වෙනත් යමක් තුළ ගිලී යන්නාහුය.....

සාමාන්‍ය ලිංගික සන්තෘප්තියේදී ඔබ දෙදෙනා එක් වන්නේ මහත් වූ උද්දීපනයෙන් යුතුවය. සාමාන්‍ය ලිංගික සංතෘප්තිය පිස්සුවක් බඳුය. තාන්ත්‍රික සංතෘප්තිය ගැඹුරු විවේක භාවනාවකි. එය මෙපමණ වේලාවක් කළ යුතු යැයි නියමයක් නැත. ශක්තිය පිටතට යාමක් නොමැති නිසා කොපමණ වේලා එහි යෙදී සිටිය ද කමක් නැත.....

එය ජීව විද්‍යාත්මක සත්‍යයකි. ස්ත්‍රිය හා පුරුෂයා යන විරුද්ධ බලවේග දෙක ගැඹුරු විවේකී භාවනාවකින් එකතු වූ විට එක් අයෙකු මගින් අනෙක් තැනැත්තාගේ ජීව ශක්තිය වර්ධනය වීම සිදුවේ."

සුවාරිස් ලිංගික වෙනස ජීව විද්‍යාත්මක කිරීමට යාමට අමතරව එය ඥානවිභාගාත්මක එකක් බවට පත්කර ඇත. අපගේ මත දැක්වීම් තුළ අප තහවුරු කිරීමට දිගින් දිගට උත්සාහ ගත්තේ ලිංගිකත්වය ජීව විද්‍යාත්මක නොවන අතර එය සංස්කෘතික එකක් වන බව පෙන්වීමය. මෙහිදී අපට ෆුකෝ මෙන්ම ඩෙරීඩා ද ඉවහල් විය. අපි ලිංගිකත්වය සංස්කෘතික එකක් වනවාට අමතරව ලිංගිකත්වය සද්භාවවාදී (Ontological) එකක් වන බව තහවුරු කිරීමට උත්සාහ ගත්තෙමු. එහිදී අපට උපකාර වූයේ ෆ්‍රොයිඩියානු, ලැකානියානු මනෝවිශ්ලේෂණය ය. නමුත් සුවාරිස් ඩෙරීඩා හා බුදු දහම හරහා විසංයෝජනයේ විකට රූපයක් දෙසට ගමන් කර ඇත. සුවාරිස් ද ඇතුළුව බොහොමයක් ලාංකික ඊනියා චින්තකයන් නොදැනම ජුංගියානු ප්‍රවේශයක් ඔස්සේ ලිංගිකත්වය තේරුම් ගෙන ඇත. ලිංගිකත්වය සම්බන්ධයෙන් අප තහවුරු කිරීමට උත්සාහ කළ අදහස මෙසේ සංක්ෂිප්ත කරමු.

අපි සාමාන්‍යයෙන් හස්ත සේවනය, පරිකල්පනීය ලිංගික ක්‍රියාවක් ලෙස ගනිමු. මෙම ක්‍රියාවේදී සහකාරිය සමග ඇති කරගන්නා ශාරීරික සම්බන්ධය පරිකල්පනීය එකක් කරමු. නමුත් ඇත්ත සහකාරිය සමග වන ශාරීරික සම්බන්ධයත් හස්ත සේවනයට වඩා වැඩි යමක් නොවේ. ඇත්ත ලිංගික සම්බන්ධයකදීත් මිනිසෙකුගේ සහකාරිය ඇත්ත ශරීරයක් වන්නේ නැත. ඇගේ සත්තාව සංසර්ග යට ආධාරකයක් වන්නේ නැත. ඇයව හුදෙක් මිනිසාගේ ෆැන්ටසිමය වස්තුවක් (woman qua a) පමණක් බවට පත් වේ. මේ අර්ථයෙන් සද්භාවාත්මක ලෙස ලිංගික සම්බන්ධයක් යනුවෙන් දෙයක් නැත. නමුත් සුවාරිස්ට අනුව ලිංගික සම්බන්ධයක් යනුවෙන් දෙයක් ඇත. ඒ තුළ පිරිමියාගේ ශුකාණු ගැහැනියට ලබාදෙයි. එවිට පිරිමියාගේ ආත්මය අහෝසි වෙයි. පසුව ඔහු නින්දට වැටෙයි.

පාරභෞතිකවාදය, සද්භවවාදය මගින් අධ්‍යනය කරන්නේ සත්තාව (Being) විනා සත්තාවන් (Beings) නොවේ. (Metaphysics studies the causes and principles of beings qua beings but not things qua countable and measurable). ජීව විද්‍යාවෙන් ගැළවීමට ඩෙරීඩා මාවතක් විවෘත කරදී තිබියදීත් සුවාරිස් ජීව විද්‍යාවට අසුවී ඇත. ලිංගික වෙනස කාන්ටියානු අර්ථයෙන් න්‍යාය විරෝධයක් (antinomies) ආකාරයට සැකසී ඇත. මේ අනුව පුරුෂත්වය හා ස්ත්‍රීත්වය ප්‍රතිවිරුද්ධ ධ්‍රැව දෙකක් නොවන අතරම තාඕ ආගමේ යින්-යැන් සම්බන්ධයක් ද නොවේ. තන්ත්‍රියානු ප්‍රතිබද්ධයක් ද නොවේ. සුවාරිස් කියන ආකාරයට ශුකාණු හුවමාරු කරගන්නා ක්‍රීඩාවක් ද නොවේ. ලිංගික වෙනස එකිනෙක සම්බන්ධ කළ නොහැකි පරතරයකින් (parallax gap) යුත් එකකි. මේ අනුව ලිංගික (අ)සම්බන්ධයක් ක්‍රියාත්මක වන්නේ ඥානවිභාගය අත්හිටුවෙන බුද්ධියේ ආලෝකයක් නැති, මළ පුඩුවක්, අසංඝත බවක්, විරුද්ධාභාසමය බාධාවක් තුළ ය. ලිංගික සම්බන්ධය තුළ හැමදාම පැල්මක් ඉතිරි වේ. අපොහොසත් වීමක් ඉතිරි වේ. ලිංගික සම්බන්ධයකින් ආත්ම පූර්ණයක් හෝ සුවාරිස් කියන ආකාරයට

ආත්මය අහෝසි වීමත් සිදුවන්නේ ද නැත. ලිංගික සම්බන්ධයකින් පසුවත් ශේෂ වන දෙය ආත්මයයි. ලිංගික සම්බන්ධයකින් තමන්ගේ ආත්මය අහිමි වනවා යැයි සිතා එයින් වැලකීම අයිති වන්නේ මානසික රෝගයකට ය.

සුවාරිස්ගෙන් ලබාගත් ඉහත උපුටනය තුළ ආත්මීයත්වය, මමත්වය හා පරාරෝපණය සම්බන්ධයෙන් හේගල් හා ඩෙරීඩාගේ අදහස් ගැන සඳහන් කර තිබෙන අතර ඒ තුළ ද බිහි කෙරී තිබෙන්නේ විසංයෝජනයේ විකට රූපයන්ය.

ඩෙරීඩා différance හා trace යන ප්‍රවේශයන් වර්ධනය කරන්නේ විඥානවාදී සම්ප්‍රදායට එරෙහිවය. විඥානවාදී සම්ප්‍රදායේ එන 'එයටම ඉදිරිපත් කර ගන්නා ආත්මය (self-present subject) ඩෙරීඩා විසින් ප්‍රශ්න කරනු ලබයි. ඩෙරීඩාට මේ ව්‍යාපෘතියේදී ඉවහල් වන්නේ හෛඩගර් විසින් විඥානවාදී ආත්මීයත්වයට එරෙහිව මතු කළ විසංයෝජන ප්‍රවේශයය. ඩෙරීඩා පාරභෞතික ආත්මීයත්වයට එරෙහිව ගෙන හැර දක්වන විකල්පය කුමක්ද? ඩෙරීඩා හේගල්ට පමණක් නොව ෆ්‍රිගේ හා කාන්ට් විසින් වර්ධනය කෙරෙන ආත්මීයත්වය පිළිබඳ අදහසටත් එරෙහි වෙයි. ඩෙරීඩා *Who Comes After the Subject* නම් පොතට ලබාදෙන ලිපියකින් හේගල්ගේ ආත්මීයත්වය පිළිබඳ සංකල්පය හඳුන්වන්නේ *absolute origin, pure will, identify to self or presence to self of consciousness* ලෙසය. මේ අනුව හේගල් අතින් මතු කෙරී තිබෙන්නේ පැමිණීමේ පාරභෞතිකයකි (metaphysics of presence). හේගල් Philosopher of Presence වල තවත් එක් අවතාරයකි. හෛඩගර්ගේ *Being and Time* කෘතියේ හේගලියානු ආත්මීයත්වය පරාවර්තිත ආකෘතිමය (reflective modle) එකක් ලෙසට දක්වයි. හෛඩගර්ට අනුව එය අයිති වන්නේ පාරභෞතික සම්ප්‍රදායටය (reflective subject is a subject that is self-identical). එය විවෘත වන්නේ එයටමය. එයට ඇත්තේ ස්වඅන්තර්ගතයන්ය (self-contained). හෛඩගර් Dasein නම් සංකල්පය ගෙන එන්නේ විඥානවාදී ප්‍රවේශයේ එන ස්වයං සාමාන්‍යයට (self-identical) එරෙහිව ය. Dasein විවෘත වන්නේ සත්තාවට ය. (Dasein=being-there) මනුෂ්‍ය සත්තාවට හෛඩගර් ලබාදුන් නම වූයේ Dasein යන්න ය. එය ආත්මීයත්වයට වඩා ප්‍රාථමිකය. හෛඩගර්ට අනුව Being එයටම ඉදිරිපත් වන්නක් ලෙස ගත නොහැකි ය. හෛඩගර් තමන්ගේ *Basic Problems of Phenomenology* කෘතියේ සඳහන් කළේ ඩෙකාට්ස්ගේ දර්ශනය අලුත් ආරම්භයක් නොවන බව ය. දෙවියන් ආත්මය හා ස්වභාවය පිළිබඳ සම්ප්‍රදායික සද්භවවාදී (Ontological) සංකල්පයන්ට ඩෙකාට්ස් අතින් ඥානවිභාගාත්මක (Epestemological) හා භවවාදී (ontical) තේරුමක් ලැබී තිබෙන බව ය. (ඩෙකාට්ස් යමෙකුට නිශ්චිතව දැනගත හැක්කේ ආත්මය, දෙවියන් හා ලෝකය බව ප්‍රකාශ කර සිටියේ ය).

ඩෙරීඩා, හේගල් ඉදිරිපත් කර සිටින Aufhebung ඉදිරිපත් කිරීම පැමිණවීමක් (presence) ලෙස ගනී. මේ උත්කර්ෂය (sublation) මගින් හේගල් කියන්නට ගියේ සෑම දයලෙක්තික උත්කර්ෂයක්ම (dialectical Aufhebung) අසම්පූර්ණත්වයන්

නිශේධ කිරීමක් (negation) නමුත් ඉහළ තලයකදී එහි සාරය සංරක්ෂණය කිරීමක් (preservation) කරන බව ය. මේ සංරක්ෂණය අභ්‍යන්තරීකරණයක් (Interiorization) හරහා සිදුවෙයි. මෙම උත්කර්ෂයේ සෑම වස්තුවක්ම චින්තනයේ වස්තුවක් බවට අභ්‍යන්තරීකරණය වේ. මේ අනුව හේගල්ගේ ස්ව-විඥානය (self-consciousness) Aufheburg ශරීරගත කරගනී. හේගල් අතින් සිදුවන්නේ දාර්ශනික සම්ප්‍රදායේ එන පාරභෞතික ප්‍රතිවිරෝධයන් එක්සත් ව්‍යුහයක් තුළ විසඳා දැමීම ය. ස්වයං පැමිණවීමක් (self-presence) එනම් Aufheburg තුළ විසඳා දැමීම කි. ඩෙරීඩා තමන්ගේ *Position* කෘතියේදී මතුකරන්නේ මේ අදහස් ය. ඩෙරීඩාගේ différance හේගලියානු differance නොවේ. හේගල් මෙයින් කතා කළේ තර්ක විද්‍යාවේ විසංවාදයන් ය. ඩෙරීඩාගේ différance මගින් ප්‍රතිවිරෝධයන් සමහන් කරනවා වෙනුවට ඒවා අස්ථාවර කර දමයි. හේගල්ගේ පද්ධතියේ ඇති නිශේධනීයත්වයට (negation) ඩෙරීඩාගේ différance ඉඩ නොදෙයි. ඩෙරීඩා differance කැඳවන්නේ හේගල්ගේ පාරභෞතික පිළිවෙලට විකල්පයක් ලෙසට ය. ඩෙරීඩා කියන්නේ ඇඳී තිබෙන අස්ථාවරත්වයන්ගේ (play of differance) මගින් වෙනස්කම් නිපදවනවාය යන්න ය.

චින්තනය ලෝකය සමග අනන්‍ය නොවේ. චින්තනය ක්‍රියාත්මක වන්නේ අර්ථයන් අත්හිටුවීම (suspended) හා පරක්කු වීම (delayed) හරහා ය. වෙනත් ලෙසකින් කීවොත් වාගීශ්වරත්වය (logo) මගින් දෙය (thing) වසා දැමෙයි. මේ නිසා වස්තුව දැන ගැනීමේ සෘජු ප්‍රවේශයක් නැත (world is deferred). ඩෙරීඩාගේ différance මගින් ඕනෑම පෙනී සිටීමක නොපෙනී සිටීමේ යාන්ත්‍රණයක් (disappearence of any originiary presence) ඇති බව කියා සිටියි. Dissemination වල ඩෙරීඩා කියා සිටින්නේ différance වලට ද්විත්ව චරිත ලක්ෂණයක් ඇති බව ය (at once the condition of possibility and the condition of the impossible of truth). මේ ආකාරයේම ද්විත්ව චරිත ස්වභාවයක් ආත්මීයත්වයට ද ඇත. එයටම සමාන වන ආත්මීයත්වයට (self identical subject) ඩෙරීඩා විරුද්ධය. ඩෙරීඩා අහන්නේ ආත්මීයත්වයේ පිටත කුමක්ද යන්න ය. ඩෙරීඩා *Position* වල මෙවැන්නක් කියයි. *"the subject is constituted only in being divided from itself"*. ආත්මීයත්වය සද්භාවාත්මක ලෙස දෙබිඩිවී ඇත යන්න ෆ්‍රොයිඩියානු මනෝවිශ්ලේෂණය හරහා තහවුරු වූ අදහසකි. ඩෙරීඩා තවදුරටත් *Position* වල දක්වන්නේ ආත්මීයත්වයට කලින් différance එන බව යි.

"subjectivity like objectivity is an effect of difference, an effect inscribed in system of différance"

différance යන්න *subject [object, interior] exterior* ආදී විසටනයන්ට කලින් එන බව යි. ආත්මීයත්වය ලෝකය සමග හෝ භාෂාව සමග සහජීවනයට ගන්නේ නැත. ආත්මීයත්වයට කලින් différance පැමිණෙන නමුත් එය ආත්මය සමග එකට සිටී. මේ නිසා ආත්මයට ඒකීය ආකෘතියක් (unified form) නැත

. ආත්මයේ ඇති බෙදීම සමනය කළ නොහැකි ය (unreconcile). ආත්මයේ අනන්‍යතාවය වෙනස ගැබ්කරගත්තකි (*identity is a self-differentiating idention*). ආත්මය එය සමගම ඇති පරතරයකි (gap). ආත්මීයත්වය එයටම වඩා වැඩි දෙයකි (*more than itself*). එය සෑදෙන්නේ එය ඉක්මවා යන දෙයින් ය (*constituted by what exceeds it*). ඩෙරීඩාට අනුව ආත්මීයත්වය හුදෙක් පැලුණු චරිත ස්වභාවයක් පමණක් නොව අහිමි වීමක් අත්විඳින්නකි. ඩෙරීඩාගේම භාෂාවෙන් කීවොත්

"This loss is originally a loss of what one never had"

ඩෙරීඩා ආත්මීයත්වය සම්බන්ධයෙන් දරන මේ අදහස් කල ලිංගික සම්බන්ධයේදී ශුකාණු පිටවීමෙන් අහෝසි වන ආත්මයක් ගැන කියවේද?

හේගල් කතා කරන ආත්මීයත්වය තමන්ගේ *Phenomenology* පොතෙහි self-consciousness යටතේ සාකච්ඡා වේ. හේගලියානු ආත්මයක් ඝණීභූත (fix) එකක් නොවේ. එය තවදුරටත් ඩෙකාට්ස්, කාන්ට් හෝ ෆිෂේ කතා කරන ආත්මය ද නොවේ. හේගල් *Philosophy of Right* වල අවධාරණය කරන ආකාරයට සදාචාරය, ආර්ථිකය, සමාජය හා දේශපාලන අවකාශයෙන් වියෝ වූ ස්වායත්ත ආත්මයක් නැත. හේගලියානු ආත්මය තේරුම් ගත යුත්තේ සමාජීය හා ඓතිහාසික සන්දර්භයක් තුළ තබාය. හේගල්ට අනුවත් ආත්මීයත්වයට අනුභූතිඋත්තර අනන්‍යතාවයක් නැත. ආත්මීයත්වය මනස් පීඨයන්ට සීමා නොවන අතර එය ස්වභාවික එකක් වන්නේ ද නැත. හේගලියානු ආත්මීයත්වයේ, අධ්‍යාත්ම සාරයේ (spirit) ලක්ෂණය නිශේධනත්වයයි (Negativity). ආත්මයේ සිදුවන ස්වයං පරිවර්තනය නිශේධනයේ ඵලය කි. හේගල්ගේ *Phenomenology of Spirit* වල physiognomy to phrenology යනුවෙන් අදහස් දැක්වීමක් ඇත. Physiognomy යනු ශරීර භාෂාව ආශ්‍රයෙන් එනම් ආත්මයක අභ්‍යන්තරත්වය ශරීර චලනයන් හරහා ප්‍රකාශයට පත්වීම තේරුම් ගැනීමේ විද්‍යාව කි. නමුත් මෙය අසාර්ථක වූයේ ආත්මය හැඟවුම්කාරකවලින් පාවාදීම යි. කිසිම හැඟවුම්කාරකයකට ආත්මය නිරූපණය කිරීමට අපොහොසත් වෙයි. නමුත් phrenology වලට විතැන් වුණා යනු හිස්කබල වෙත ගමන් කිරීම ය. හිස්කබල මගින් කිසිවක් නිරූපණය නොකෙරෙයි. එනිසා එය ආත්මය අව්‍යවහිතව පෙනී සිටීමේ (*immediate presence of the spirit*) මාර්ගය ය. එයින් පෙන්නුම් කරන්නේ ආත්මය නිරූපණය කිරීමේ නොහැකියාව ය. අඩුව ය. අපොහොසත්භාවය ය. සාරයේ ඇති ස්වයං පැල්ම ය (self-fissure). තමන්ටම ඇති පරාරෝපිත ස්වරූපය ය. එයටම ඇති පරිබාහිර බව ය (external to it self). මෙයින් සංසර්ගයේදී ශුකාණු පිටවීමෙන් සිදුවන සුවාරිස් අවධාරණය කරන ආකාරයේ පරාරෝපණයන් සිදුවන්නේ නැත. ජර්මන් විඥානවාදය තුළ ආත්මීයත්වය හඳුනාගන්නේ නිශේධත්වයක් (self-relating negativity) ලෙසට ය. ලැකාන් මෙය හඳුනාගන්නේ අභ්‍යන්තරික බාහිරත්වයක්

internal externality=extimacy ලෙස ය. සත්තාවට වඩා සත්තාවක් (being more than being itself)ලෙස ය. හේගල්ගේ Aufhebung තුළ සුවිශේෂ අන්තර්ගතයන් දිය කර හැරීය යන්න එය මගින් කිය වේ.

Destruction is always at the same time a preserving, a resurrection always follows death යන්න යි. මේ සෑම අදහසකින්ම කියවෙන්නේ නිශේධනයේ බලය යි.

සුවාරිස්ගේ ලිපියේ ප්ලේටෝගේ සිට හේගල් දක්වා පරාරෝපණ මූලධර්මය ස්ත්‍රී යෝනියක් තුළ සිරකර දැමීමෙන් විසංයෝජන විකට රූපයක් බිහිකර තිබෙනවාට අමතර ව විශේෂයෙන්ම හේගල් දැඩි දාර්ශනික ගැඹුරකින් මතු කළ පරාරෝපණය අති සරල කිරීමක් ද කර ඇත. දේවධර්මය අතැඹුලක් සේ හදාරා ඇතැයි කියන සුවාරිස්ට දේවධර්මයේම තිබෙන විශිෂ්ට පරාරෝපණ නිර්වචනයන් මඟහැරී යයි.

Eyes they have and they do not see, ears they have and do not hear

මේ අදහස ඇත්තේ බයිබලයේ පරණ තෙස්තමේන්තුවේ ය. ප්ලේටෝ පවසා සිටියේ ස්වභාවික ලෝකය (ප්‍රපංච ලෝකය) වනාහි ශුද්ධ වූ ආකෘතික ලෝකයේ අසම්පූර්ණ දුර්වල පිටපතක් බව යි. හේගල් පවසා සිටියේ සොබාදහම වනාහි පරම ස්ප්‍රිතුවේ (spirit) පරාරෝපිත ආකෘතියක් බව යි. හේගල්ගේ *Phenomenology* කෘතියේ සුප්‍රකට ඉදිරිපත් කිරීමක් වූයේ *'Mind alienated from itself* යන්න යි. හේගල් පරම යථාර්ථය ලෙස ගත්තේ *Absolute Idea (Absolute Mind)* ය. එය නිරන්තරයෙන් පරාරෝපණය වීම හා පරාරෝපණයෙන් මිදීම (de alienation) වශයෙන් චක්‍රීය ක්‍රියාවලියක යෙදී සිටියි. මේ ස්වයං පරාරෝපිතය මිනිසාටත් (finite mind) පොදුය. මිනිසා ස්වභාවික සත්තාවක් වන අතර ඔහු/ඇය ස්වයං පරාරෝපිත ආත්මයකි. පරාරෝපිතව සිටින සිය ආත්මයට පරමත්වය (Absolute) පිළිබඳ පරිපූර්ණ ඥානය අත්පත් කරගෙන පරාරෝපිත නොවූ සත්තාවක් (de-alienated being) බවට පත්විය හැකි ය. මනස් සාරය වස්තුමය වීමෙන් (objectivity) භෞතික ලෝකය නිර්මාණය වේ. එමෙන්ම සමාජ ආයතන හා සංස්කෘතික නිෂ්පාදනයක් ද වස්තුකරණයේ (objectification) ප්‍රතිඵලයකි. හේගල්ට අනුව පරාරෝපණය දයලෙක්තික ක්‍රියාවලියේ අනිවාර්ය අංගය කි. පරමත්වය සොයාගෙන චින්තනය වර්ධනය වන විට චින්තනය එළියට යාම (externalization) සිදුවෙයි. මේ එළියට යෑම මනුෂ්‍ය එකක් වන අතර එළියේ ඇති දෙය තමන්ගෙන්ම එළියට යාමක් බව දැන ගැනීම අභ්‍යන්තරීකරණයක් (internalization) වේ. එය දිව්‍යමය කටයුත්තකි. හේගල්ට අනුව මිනිස් ඉතිහාසය යනු පරාරෝපණයේ ඉතිහාසයය (Entfremdung=estrangement). හේගල් පරාරෝපණය ප්‍රතිජානනමය එකක් ලෙස හඳුනාගෙන ඇත. *Phenomenology* කෘතියේ එය මෙසේ දක්වයි.

It is the alienation (Entäusserung) of self consciousness that posits thing hood (die Dingheit) and that than alienation has not mercy a negative but a positive meaning..... that self consciousness has equally sublated [aufgeboben]

හේගල් දක්වා සිටින උත්කර්ෂණය (Aufhebung=sublation)මගින් *Science of Logic* වල දක්වන ආකාරයට ද්විත්ව කාර්යයක් ඉටු කරයි. විනාශ කිරීම හා ශේෂගත කර ගැනීම (abolition and preservation) නිශේධනය හා තහවුරු කර ගැනීම (negation and affirmation) සිදුකරයි. සද්වස්තූන් සහිත ලෝකය ගොඩ නැගීමේ ක්‍රියාවලියට දුන් ජර්මන් වචනය Entäusserung යන්න යි. එය පරිබාහිරකරණය කි (externalization). මේ ක්‍රියාවලිය ආපසු හැරවීම 'Er-Innerung' ය. එය පරිබාහිරකරණය නතර කිරීම ය. එළියට ගිය දෙය ඇතුළතට ගැනීම කි (internalization). හේගල්ගේ මේ පරාරෝපණ සංකල්පය සුවාරිස්ගේ මෙන් සරල ද?

ජාතියේ ආත්මය සම්බන්ධයෙන් සුවාරිස් මෙවැනි අදහස් දැක්වීමක් කරයි.

"ජර්මන් බුද්ධිමතුන් කිව්වේ ප්‍රංශකාරයෝ, ඉංග්‍රීසිකාරයෝ හැම විට උතුම් කරන්නේ පිටස්තර හැසිරීම කියාය. ..... ජර්මන් බුද්ධිමතුන් කීවේ මීට වඩා උතුම් 'අභ්‍යන්තරික ශිෂ්ටත්වය' කියලයි. මේ පාරිශුද්ධ ආත්මිකත්වය එන්නේ ජාතික ආත්මයෙන් කියා. එනිසා ජර්මන් සම්ප්‍රදායේ 'සිවිලයිශේෂන්' කියන වචනය නෙවෙයි උපයෝගී වන්නේ. ඔවුන් උතුම් ශීලාචාරයට පාවිච්චි කරන්නේ 'කුල්ටූර්' (kultur) කියන වචනය. මෙය තේරුම් කර ගැනීම ඉතා වැදගත්. මේ ඉංග්‍රීසියෙන් 'සංස්කෘතිය' (culture) කියන වචනය නොවේ. .....ජර්මන් භාෂාවේ සිවිලයිශේෂන් (civilization) කියන වචනයෙන් හඳුන්වන්නේ මේ බාහිර භාවිතාවලට. ඔවුන් ජාතියේ උත්කෘෂ්ඨත්වය සඳහන් කරන්නේ 'කුල්ටූර්' (kultur) කියන වචනයෙන්."

මෙසේ ලියන සුවාරිස් සිංහල බෞද්ධ සංස්කෘතිය ගැනත් මෙසේ ලියයි.


"මෑතකදී කැපී පෙනෙන විශ්ව විද්‍යාල උගතුන් පිරිසක් සහ සිංහල බෞද්ධ ජාතිකවාදීන් 'ජාතික චින්තනය' කියන මූලධර්මය ගෙනත් තිබෙනවා.....

සිංහල බෞද්ධ සංස්කෘතිය ජාතික චින්තනයෙහි නිෂ්පාදිතයක් විදිහට කතා කරන විට මොවුන් 'සංස්කෘතිය කියන්නේ මිනිසුන්ගේ අනුභූතිකව නිරීක්ෂණය කළ හැකි හැසිරීම් හැටියට ගෙන නොවෙයි. සමාන්‍ය හැසිරීමේදී ධනාත්මක දේවල් බොහොමයක් තියෙනවා. විශේෂයෙන්ම අපේ

ගම්බද සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර. නමුත් මෙය නෙමෙයි මෙම උගතුන් අදහස් කරන්නේ. මොවුන් අපේ සංස්කෘතියේ සහ ඉතිහාසයේ ශුද්ධ අංග කිහිපයක් තෝරාගෙන මෙම අනුභූතිකව නිරීක්ෂණය කළ හැකි හොඳ ගුණාංග ජාතික චින්තනයේ පිළිඹිබුව කියලා පෙන්වනවා. මෙයට ඓතිහාසික සම්බන්ධයක් නැහැ. මෙය අවසාන වශයෙන් ගත්තහම පාරභෞතික දෙයක්."

නමුත් 1997 දී මෙසේ කියූ සුවාරිස් ඉන් වසර 10 කට පසු ජාතික චින්තකයෙක් විය. දෙමළ විමුක්ති අරගලයට එරෙහිව ආණ්ඩුවේ යුධවාදීන්ගේ පැත්ත ගත්තේය. The Island පුවත්පතට නලින් ද සිල්වා සමග තරගයට මෙන් නෝර්වේ රට කොටින්ට උදව් කරන ආකාරය හෙළිදරව් කරමින් දෙමළ ත්‍රස්තවාදය අවසන් කිරීමට මතවාදය ශක්තිමත් කරන තවත් එක් න්‍යායාචාරියෙකු බවට පත්විය. ඔහු අද වනතෙක් දෙමළ ජනයා සමූල ඝාතනය කිරීම සම්බන්ධයෙන් විවේචනයක් මතු කර නැත. ඩෙරීඩාගේ විසංයෝජනය හෝ බුදු දහම දෙමළ ජනතාවට එරෙහිව මතවාදය පෝෂණය කිරීමේදීත් දහස් ගණනාවක් දෙමළ ජනයා මරන විට, පැහැර ගන්නා විට, ඔවුන්ගේ උන්හිටි තැන් නැති කරන විට සුවාරිස්ගේ විසංඛාර-විසංයෝජන ආත්මයට ගැටළුවක් වූයේ නැත.

උද්දාමයට ලක්කිරීම ජර්මනියේ සිදුවූ අතර එහිදී ගැඹුරු හරයක් නැති ඇංග්ලෝ සැක්සන් හෝ ප්‍රංශ ශිෂ්ටාචාරයට (civilization) එරෙහිව ජර්මන් සංස්කෘතියේ වග වර්ණනා විය. මේ ඔස්සේ සංස්කෘතිය (culture) - ප්‍රාග්තනවාදය (primitivism) ශිෂ්ටාචාරය (civilization) - ම්ලේච්ඡත්වය (babarism) වශයෙන් සංඥාර්ථවේදී චතුරස්‍රයක් ගොඩ නැගිය හැකිය.



සංස්කෘතිය ශිෂ්ටාචාරය ම්ලේච්ඡත්වය ප්‍රාග්තනවාදය

මෙයින් පැහැදිලි කරන්නේ සංස්කෘතිය හා ම්ලේච්ඡත්වය එකිනෙකින් බහිෂ්කරණය කරගන්නේ නැති බවයි. සමාජයක මේ දෙකම එකට පැවතිය හැකිය. ජර්මනියේ එය සිදුවූ අතර අද ලංකාවේ දැනටත් එය සිදුවේ. ම්ලේච්ඡත්වයේ ප්‍රතිවිරෝධය සංස්කෘතිය නොව ශිෂ්ටාචාරයය. ශිෂ්ට නොවීම (non-civilized) සමාන වන්නේ ම්ලේච්ඡත්වයටය. සංස්කෘතිය උඩ දමන්නෙකු තුළ ම්ලේච්ඡ විභවයක් පවතී. පසුගිය ශත වර්ෂයේ ලොකුම ම්ලේච්ඡත්වය නාසිවාදය විය. එහිදී ජාතියේ සංස්කෘතිය උඩ දැමූ අතර අසල්වාසී මතුපිට සංස්කෘතීන් ගර්භාවට ලක් කළේය. මේ සියවසේ ලංකාව තුළ සිදුවූ ලොකුම ම්ලේච්ඡතාවය දෙමළ ජනතාව සමූල ඝාතනය කිරීම වන අතර එහිදී සිංහල සංස්කෘතිය දෙමළ 'පහත්' සංස්කෘතියට එරෙහිව වග වර්ණනාවට ලක්විය.

Heinrich Hendrich යුදෙව් ප්‍රශ්නයට අවසන් විසඳුම යෝජනා කළ නාසි ත්‍රස්තයේ සැලසුම්කරුවා විය. නමුත් මේ Heinrich ම දහවල් වාෂ්ප කාමරවල යුදෙව්වන් දහස් ගණනාවක් ඝාතනය කර සැඳෑවේදී බිතෝවන්ගේ සංගීතය සිය යහළුවන් සමග රසවිඳීය. බිතෝවන් වනාහි ජර්මානු සංස්කෘතියේ සුපිරිම මුදුන් පමුණුවා ගැනීමක් විය. මෙයට ජර්මානු සංස්කෘතික ම්ලේච්ඡත්වය (kultuur-barbarismus) යැයි කියමු. ලංකාවේදී දෙමළ ජනතාව කුඩා බිම් කොටසක හිර කර ඔවුන්ගේ හිස් මත බෝම්බ හෙළීම, මල්ටි බැරල් ගැසීම, බෙහෙත් නොයැවීම, කෑම බීම නොයැවීම සැලසුම් කළ පුද්ගලයෝ ඊට ටික වේලාවකට පසු ශ්‍රී මහා බෝධිය ළඟ, දළදා මාළිගාව ළඟ මල් පහන් පූජා කරමින් සිටියහ. මේ මිනිසුන් මිනීමස් කෑ පූර්ව ශිෂ්ටාචාරගත මිනිසුන් නොවූහ. ටයිකෝට් දමාගෙන, ආර්ය සූට් ගහගෙන සිටි අය වූහ. ඔවුන් විරුද්ධ වූයේ ශිෂ්ටාචාරයටය. යුරෝපා ශිෂ්ටාචාරයෙන් ලොවට හඳුන්වා දුන් මානව හිමිකම්, පුද්ගල නිදහස, නීතිය ඉදිරියේ සාධාරණත්වයක් ලැබීම වැනි ශිෂ්ට අංගවලට සංස්කෘතිය අගයන ම්ලේච්ඡයන් විරුද්ධ වූහ. නලින් ද සිල්වලා, චම්පික රණවකලා, අතුරලියේ රතනලා, ගුණදාස අමරසේකරලා, සුසන්ත ගුණතිලකලා, රාජපක්ෂවරු පමණක් නොව සුවාරිස් ද ශිෂ්ටාචාරයට එරෙහි සංස්කෘතික ම්ලේච්ඡත්වය නියෝජනය කළහ. දෙමළුන් මරා දැමීම උත්කර්ෂයට නැංවූයේ ගණිතඥයන්, නීතීඥයන්, කවියන්, සමාජ විද්‍යාඥයන්, බෞද්ධ භික්ෂූන්, ඉංජිනේරුවන් හා විසංයෝජකයන්ය. ඔවුහු කිසිවෙක් බටහිර දැනුමෙන් ශිෂ්ට වූවන් පිරිසක් නොවූහ.

-සමන් පුෂ්පකුමාර